




# වාර්ෂික වාර්තාව -2011

ජාතික රක්ෂණ භාර අරමුදල

# පටුන


| | පිටු අංකය |
|---|---|
| 01.සමායතනික දර්ශනය | 3 |
| 02.ඉලක්ක සහ අරමුණු | 7 |
| 03.ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාජික මණ්ඩලය-2011 | 10 |
| 04.සභාපතිගේ සමාලෝචනය | 12 |
| 05.කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය | 15 |
| 06.තිරසාර වර්තාකරණය | 49 |
| 07.පාලන වාර්තාකරණය- සංයුක්ත පාලනය | 56 |
| 08.පාලන වාර්තාකරණය සහ අවධානම් කළමනාකරණය | 64 |
| 09.මූල්‍ය ප්‍රකාශ 2011 | 70 |
| 10.විගණන වාර්තාව | 86 |
| 11.සය වසරක සාරාංශය | 95 |
| 12.සමායතනික තොරතුරු | 98 |




# 01.සමායතනික දර්ශනය

# දැක්ම



ආරක්ෂාව අවැසි සියළු අංශයන්ට රැකවරණය හා ආරක්ෂණ ජාලයක්



# මෙහෙවර

- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියළුම අංශයන් අරබයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම

- වෙනස් වෙමින් පවත්නා අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවධානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීම් හා වෙනත් වැඩපිළිවෙලවල් තුළින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම.

- දේශීය රක්ෂණ වෙළෙඳපොලට අතිරේක ශක්නුතාව සලසාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීම.




# සමායතනික හර පද්ධති

- විශ්වාසනීය බව
- අවංකත්වය
- වගකීම
- මූල්‍ය ස්ථාවරත්වය
- වෘත්තීය කළමනාකරණය




# 02.ඉලක්ක සහ අරමුණු

- සියළුම සමාජයීය කොටස් ආවරණය කෙරෙන අපේක්ෂිත ඉලක්කගත කණ්ඩායම්වල යහසාධනය අරබයා රක්ෂණ ක්‍රම ක්‍රියාවට නංවාලීම

- ප්‍රතිරක්ෂණ වෙළෙඳපොළෙහි යටත් පිරිසෙයින් සියයට 50ක් ග්‍රහණය කරගනු පිණිස ප්‍රතිරක්ෂණ ක්‍රමයක් සැලසුම්කොට ක්‍රියාවට නංවාලීම

- ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම රක්ෂණ ක්‍රම ස්වයංකරණය කිරීම


- සියලුම ප්‍රතිලාභීනට අතිශයින් කාර්යක්ෂම සේවාවක් සලසාලනු පිණිස මානව සම්පත් සංවර්ධනය කරලීම්

- ඉදිරි පස් වසරක කාලසීමාව තුළදී පාර්ශවකරුවන්ට උපරිම ප්‍රතිලාභයක් අත්කර දීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ආයෝජන ඵලදායීව කළමනාකරණය කරලීම්

- රක්ෂණ ක්‍රමයන්ට සහභාගිවන්නන් දැනුවත් කරලීමේ අධ්‍යාපන වැඩ සටහන් මාර්ගයෙන් ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කරලීම්

- ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉදිරි මෙහෙයුම් කටයුතු පහසු කරලීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය කරලීම්

- අවදානම් කළමනාකරණ ඒකකයක් පිහිටුවාලීම සහ ක්ෂේත්‍ර අධ්‍යයනයක් පැවැත්වීම සඳහා සිය ඉදිරි රක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදලට මග පෙන්වීම්





# 03.ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාජික මණ්ඩලය -2011






2011

- සේනක ඩී අබේගුණසේකර මහතා (1) - සභාපති
- වෛද්‍ය ලෝහිත සමරවික්‍රම මහතා (3) - මණ්ඩල සාමාජික
- එන්. කුලසේකර මහතා (2) - මණ්ඩල සාමාජික
- ජේ. අඩල්ලගේ මහතා (4) - මණ්ඩල සාමාජික
- ඒ.කේ. සෙනෙවිරත්න (5) - මණ්ඩල සාමාජික
- ඩබ්.එච්. පියදාස මහතා (6) - මණ්ඩල සාමාජික




# 4. සභාපතිගේ සමාලෝචනය



**<u>වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීම - 2011</u>**

5 වන සංවත්සරය සමරන ජාතික රක්ෂණභාර අරමුදලේ **2011** වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම ගෞරවයක් ලෙස සලකමි.

**<u>සාර්ව ආර්ථික දර්ශනය</u>**

සමස්ථ ආර්ථික වර්ධනය 8.6% ඉහළ දැමීම සඳහා බැංකු සහ රක්ෂණ උප අංශය ඇතුළුව සේවා අංශය විසින් **2011** වර්ෂයේ දී 61% කින් දායක වී ඇත. ආර්ථික කටයුතු වර්ධනය වීමත් මූල්‍ය සේවා සඳහා ඉහළ ඉල්ලුමක් පිළිඹිබු කරමින් බැංකු සහ බැංකු නොවන අංශය මෙන්ම රක්ෂණ උප අංශය යන දෙඅංශයෙන්ම ඉහළ ආදායමක් සහිතව බැංකු, රක්ෂණ සහ තථ්‍ය වතු අංශය පුළුල් විය.

**2011** වර්ෂයේදී බැංකු, රක්ෂණ සහ තථ්‍ය වතු අංශයේ දායකත්වය 8.8% කි. **2011** වර්ෂයේදී මෙම අංශයේ වර්ධනය 7.9% ක් ලෙස වාර්තා විය. පෞද්ගලික අංශයේ ණයවල ඉහළ වර්ධනයක් ඇති කරමින් මෙම අංශයේ වර්ධනයට ශාඛා ජාලය සේවා සහ හිතකර සාර්ව ආර්ථික කටයුතු පුළුල් වීම උපකාරී විය.

ආර්ථික කටයුතු පුළුල් වීමට අනුරූපීව වාහන රක්ෂණය ඇතුලුව සාමාන්‍ය රක්ෂණ කටයුතු වල පුළුල්වීම රක්ෂණ උප අංශයේ කාර්ය සාධනයට උපකාරි විය. **2011** අංක 3 දරන රක්ෂණ කර්මාන්ත නියාමක පනතට කරන ලද සංශෝධන වල හේතුවෙන් රක්ෂණ අංශයට අදාළ නියාමන රාමුව ශක්තිමත් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ලියා පදිංචි කරන ලද රක්ෂණ සමාගම් වලට අමතරව **2011** වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය යටතට ගෙන එන ලදි. දීර්ඝ කාලීන සහ පොදු රක්ෂණ කටයුතු වෙන් වෙන් සමාගම්වලට බෙදා වෙන් කිරීම, අවදානම පාදක කරගත් ප්‍රමාණවත් ප්‍රාග්ධන රාමුව හඳුන්වාදීම රක්ෂණ කර්මාන්තය සඳහා වන නව සංවර්ධනයන්ය.

**<u>කාර්ය සාධනය සහ දායකත්වය</u>**

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය රක්ෂණය සහ විදේශ රැකියා රක්ෂණ ක්‍රමය, වැනි සාමාජීය .නැඹුරු රක්ෂණ යෝජනාක්‍රම රක්ෂණ භාර අරමුදල විසින් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. 2006 අංක 28 දරන රක්ෂණ භාර අරමුදල් පනතේ 2 වන වගන්තිය යටතේ අතිගරු

ජනාධිපතිතුමාගේ නියෝගය ප්‍රකාරව භාරගන්නා ලද වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ආවරණ, සාමාන්‍ය රක්ෂණ කටයුතු සඳහා රක්ෂණ ප්‍රතිපත්ති නිකුත් කිරීම සම්බන්ධයෙන් වන විශේෂ ගිණුම් කළමනාකරණය සහ රක්ෂණ සමාගම් විසින් ප්‍රතිරක්ෂණ සැලසුම් මත 20% ක අනිවාර්ය පවරා ගැනීමට භාර ගැනීම සමාලෝචිත වර්ෂය තුළ ඇතිකර ගන්නා ලද කාර්ය සාධනය වෙනුවෙන් ප්‍රධාන වශයෙන් දායකවී ඇත.

**කෘතඥතා පූර්වක ස්තූතිය**


මුදල් විෂය භාර අමාත්‍යවරයා ලෙස අතිගරු ජනාධිපති තුමාටත්, අවශ්‍ය උපදෙස් සහ මාර්ගෝපදේශකත්වය ලබාදුන් භාණ්ඩාගාර ලේකම්තුමාටත්, මණ්ඩලය වෙත ලබාදුන් සහයෝගය වෙනුවෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ සහ ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ නිලධාරීන්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය පුද කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

වටිනා දායකත්වයක් ලබාදුන් මණ්ඩලයේ සාමාජිකයන්ට මාගේ විශේෂ ස්තූතිය පුද කරමි. අප කෙරෙහි විශ්වාසය තැබූ අපගේ වටිනා සේවාදායකයන්ට සහ ව්‍යාපාරික හවුල්කවන්ට ස්තූතිය පුද කරමි.

අපගේ සේවකයන් අපගේ පදනම වේ. රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ සාර්ථකත්වය සඳහා වන ඉදිරියට යාම ඔවුන්ගේ කැපවීම මත පමණක් සිදුවේ. කළමනාකරුවන් සහ සහකාර කළමනාකරුවන්ගේ මූලිකත්වය යටතේ කැපවීමෙන් කටයුතු කරන කාර්ය මණ්ඩලයට ස්වකීය කැපවීම වෙනුවෙන් මගේ කෘතඥපූර්වක ස්තූතිය මෙයින් පුද කරමි.

අ.කළේ / ඩී. විදානගමාච්චි

සභාපති




# 5. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

# 5.1 පොදු සමාලෝචනය

සාර්වාර්ථික මිල උච්චාවචනයන් මගින් ජාතික රක්ෂණ භාර අරමුදලේ වෙළඳ මෙහෙයුම්වලට සාරානුකූලව බලපෑමක් ඇති කරනු ලබන බවට ජාතික රක්ෂණ භාර අරමුදලේ ජොෂ්ඨ කළමනාකරණය දැන සිටියි. ඊට හේතුව ශ්‍රී ලංකාවේ සියලුම ආර්ථික සංවර්ධනයන් අසාර්ථකවීමේ අවදානමක් දරන අතර මේ සඳහා වැඩි වශයෙන් ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම්වලින් රක්ෂණාවරනය ලබා ගැනීමෙන් මෙකී අවදානමට මුහුණ දෙන අතර අනෙක් අතට මෙම රක්ෂණ සමාගම් විසින් ස්වකීය අවදානම් 20% ප්‍රතිරක්ෂණය කිරීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදලට පවරයි. ඉතිරි කොටස විදේශීය ප්‍රතිරක්ෂකයෙකුට පවරයි. එබැවින් ජාතික රක්ෂණ භාර අරමුදල රටේ සාර්වආර්ථික සංවර්ධනයේ සුපරික්ෂාකාරීව අඛණ්ඩව අධීක්ෂණය කරයි.

**<u>සාර්ව ආර්ථික සමාලෝචනය</u>**

ඉතිහාසයේ පළමු වතාවට, ශ්‍රී ලංකාවේ අඛණ්ඩ වසර දෙකක කාලය තුළ (2010 සහ 2011) 8% කට වැඩි ආර්ථික වර්ධනයක් වාර්තා කර ඇත. ද.දෙ.නි. ඇ.ඩො. බිලියන 59 ඉක්මවා යාමට ඇස්තමේන්තුගත කළ අතර 2011 වර්ෂයේදී ඒක පුද්ගල ආදායම ඇ.ඩො. 2830 ක් විය. පසුගිය වර්ෂ දෙකක කාලය තුළ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලැබූ 8% කට වැඩි ආර්ථික වර්ධනයක් පිළිඹිබු කරන්නාවූ ඇ.ඩො. 4000 ක පරාශයක් තුළ ඒක පුද්ගල ආදායමක් ඇති කර ගැනීම සඳහා 2016 වර්ෂයේදී ආර්ථිකය වර්ධනය කළ යුතු බවට ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපතිතුමා විසින් ප්‍රකාශ කර ඇත. උද්ධමනය තනි ඉලක්කමකින් ස්ථාවරව පවත්වාගෙන යනු ලැබූ අතර දරිද්‍රතාවයද සැළකිය යුතු ප්‍රමාණයකින් අඩුවී ඇත.

2011 වර්ෂයේදී විදේශ වෙළඳාම ශක්තිමත්ව පැවති අතර 2010 වසරේ දළ දේශීය නිෂ්පාදනයෙන් 44.4% පැවති ආනයන අපනයන දායකත්වය 51.6% ඉහළ අගයක් වාර්තා කරමින් අපනයන ආනයන පුළුල් විය. 2011 වර්ෂයේදී ඇස්තමේන්තුගත විදේශ ශ්‍රමිකයන්ගේ ප්‍රේශණ ඇ.ඩො. බිලියන 5.2 පමණ වූ අතර පසුගිය වසර හා බලන කල එය 27% ක ඉහළ යාමකි. දළ දේශීය නිශ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් එය 8.8% ක් වූ අතර, මුළු විදේශීය ලැබීම්වල ප්‍රතිශතයක් වශයෙන් එය 18% ක් විය.පුහුණු ශ්‍රමය සංක්‍රමණය සහ බැංකුකරණ මූලාශ්‍ර මගින් ප්‍රේෂණ යැවීම සඳහා වැඩි දියුණු කරන ලද සැලසුම් කෙරෙහි අවධානය යොමු කිරීම මෙකී වර්ධනයට එක් ප්‍රධාන හේතුවකි.

2011 වර්ෂයේදී කර්මාන්ත අංශය 10.3% කින්ද, සේවා අංශය 8.6% කින්ද ඉහල ගිය අතර කෘෂි අංශය 1.5% කින් වර්ධනය විය.

සමාලෝචන වර්ෂය තුළ සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් ට්‍රිලියනයක් දක්වා ලඟා විය.ලෝක තරඟකාර්ය දර්ශකයේ 52 ස්ථානයේ සිට 62 ස්ථානය දක්වා ඉහල යාමත්, ව්‍යාපාර කටයුතු කිරීමේ දර්ශකයේ 8 වන දර්ශකයට පැමිණීමෙන් ශ්‍රී ලංකාව 7 වන තැනට පත්වී ඇත.

2011 වර්ෂයේ සංචාරකයන් 855,000 ක් පැමිණි බවට වාර්තා වූ අතර එය පසුගිය වසරට වඩා 38% ක ඉහල යාමකි. සංචාරක කර්මාන්තයේ ඉපයීම් 47% කින් වැඩිවූ අතර එක් සංචාරකයෙකුට රාත්‍රියකට වියදම් කරන සාමාන්‍ය මුදල 2010 දී ඇමෙරිකානු ඩොලර් 88 ක් වූ අතර එම ප්‍රමාණය 2011 වසරේදී ඇමෙරිකානු ඩොලර් 97 දක්වා වැඩිවිය. කොළඹ කොටස් වෙළඳපොල වර්ෂයේ මුල් මාසවල වර්ධනයක්ද, දෙවන භාගයේදී පහත වැටීමක්ද සහිතව මිශ්‍ර ප්‍රතිඵල වලට මුහුණ දුන් අතර 2011 වසරේදී පොදු මහජනයාට මූලික උප ප්‍රධාන සහ හිමිකම් නිකුතුව ඉහළ යාමෙන් අරමුදල්ද ඉහළ යන ලදි. බිලියන 2214 ක වෙළඳපොල ප්‍රාග්ධනකරණයේ 0.86 ක ප්‍රතිශතයක් වූ ශුද්ධ විදේශ ගලායාම් 2011 වර්ෂයේ දී බිලියන 9 කි. 2011 වර්ෂයේදී කොටස් වෙළඳපොල හරහා ශුද්ධ විදේශ ගලායෑම් රජයේ සුරැකුම්පත් සඳහා රට තුළට විදේශීය ගලා ඒම් මහ හරවා ගනු ලැබූ එය රුපියල් බිලියන 25 ක වැඩිවීමකි. ඊට අමතරව, 2011 වසර අවසන්වන විට විදේශීය ආයතනවල මුළු කොටස් වටිනාකම රුපියල් බිලියන 437 ක් විය. (මුළු වෙළඳපොල ප්‍රාග්ධනකරණයෙන් 20% ක් පමණ)






2011 වර්ෂය තුළ කොළඹ වරාය පුළුල් කිරීමේ ව්‍යාපෘතිය වැනි බොහෝ සර්ව ආර්ථික ව්‍යාපෘති ආරම්භ කරන ලදි. 2011 වර්ෂය තුළ මාගම්පුර මහින්ද රාජපක්ෂ වරාය, නෙළුම් පොකුණ මහින්ද රාජපක්ෂ රඟහල සහ නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය වැනි බොහෝ සර්වආර්ථික ව්‍යාපෘති ආරම්භ කරන ලදි.



**රක්ෂණ කර්මාන්තය සමාලෝචනය**

රක්ෂණ කර්මාන්තයට 2011 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂය තුළ ප්‍රශස්ත වර්ධනයක් අත්කර ගැනීමට හැකිවිය. 2011 වර්ෂය අවසානයේදී රක්ෂණ සමාගම් විසිදෙක (22) ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය (රක්ෂිකයන්) ලියාපදිංචි වී තිබුණි. එයින් රක්ෂණ සමාගම් 21 ක් ක්‍රියාත්මකව පවතී. එයින් සමාගම් 12 ක්

සමයෝජිත සමාගම් වන අතර (සාමාන්‍ය හා දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරවල නියුතු) එයින් 07 ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ලියාපදිංචි වී ඇත්තේ දීර්ඝකාලීන (ජීවිත) රක්ෂණ ව්‍යාපාරයේ නියැලී සිටීම සඳහාය.

පෙර වර්ෂයේ රුපියල් මිලියන 66253 ක් වූ දළ ලිඛිත වාරික ආදායම සසඳන කල්හි දීර්ඝකාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්ගේ සමස්ථ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 78512 ක් වූ අතර එය 18.50% වර්ධනයක් පිළිඹිබු කරයි. 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය සිය සමස්ථ දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේම 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය ද සිය දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනයක් පෙන්නුම් කර ඇත. එසේම 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරය ද සිය දළ ලිඛිත වාරික ආදායමේ වර්ධනයක් ඇතිකර ගන්නා ලදි. 23.45% වර්ධන අනුපාතයක් පිළිඹිබු කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ සමස්ථ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 43,331 කින් (2010 රුපියල් මිලියන 35,101) වැඩි වි ඇති අතර, 12.93% වර්ධන අනුපාතයක් පිළිඹිබු කරමින් පසුගිය වසරතුළ දීර්ඝකාලීන රක්ෂණ ව්‍යාපාරයේ සමස්ථ දළ ලිඛිත වාරික ආදායම රුපියල් මිලියන 35,181 (2010 රුපියල් මිලියන 31,152) කින්ද වර්ධනය වී ඇත.

**ජාතික රක්ෂණ භාර අරමුදලෙහි කාර්යභාරය**


8% කට වඩා වැඩි ආර්ථික වර්ධනයක් අත්කර ගැනීමත් සමඟ ශ්‍රී ලංකාවේ තේමාව වන "ආසියාවේ ආශ්චර්යය" දෙසට යොමුවීම, අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ විශිෂ්ට සහ දුරදක්නා නායකත්වය යටතේ සිදුවුණු අතර ජාතික රක්ෂණ භාර අරමුදලට, ජාතික ප්‍රතිරක්ෂකයා වශයෙන් 2011 වර්ෂය තුළ සහභාගි වූ ආර්ථික ක්‍රියාකාරකම්වලින් ව්‍යුත්පන්න වූ අවධානම්වලින් සැලකිය යුතු කොටසක් අන්තර්ග්‍රහණය කර ගැනීමට හැකිවිය. සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන්, ප්‍රතිරක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ වැඩසටහන් ආදී විවිධ රක්ෂණාවරණ සැපයීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකාවේ ඉලක්කයන් දෙසට තම දායකත්වය ලබාදී ඇත.

ශ්‍රී ලංකාව තුළ ප්‍රධාන සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා වගකිව යුතු රාජ්‍ය අංශයේ සේවකයන් සඳහා සහ විදේශ විනිමය රටට ගෙන එන විදේශ සේවා නියුක්තිකයන් සඳහා රටේ ශ්‍රම බලකායෙන් විශාල ප්‍රමාණයකගේ සෞඛ්‍ය තත්ත්වය ආරක්ෂා කිරීම සඳහා මෙම සෞඛ්‍ය රක්ෂණ වැඩසටහන් සකස් කර තිබේ. ජාතික රක්ෂණ භාර අරමුදල සතු තවත් වගකීමක් වන්නේ ඉදිකිරීම් සහ සංවර්ධනයට අදාල රක්ෂණාවරණ වන, සියලුම ඉලෙක්ට්‍රොනික අවධානම් (EAR). වෙළෙන්දන්ගේ සම්ගම්. කොන්ත්‍රාත්කරුවන්ගේ සියලු අවධානම් (CAR), සේවක වන්දි ගෙවීමේ රක්ෂණ ( WCI) ආදී රක්ෂණාවරණ සැපයීම යි. එසේම, ප්‍රතිරක්ෂණ වැඩසටහන යටතේ, ශ්‍රී ලංකාවේ අනෙකුත් සාමාන්‍ය රක්ෂණ සමාගම්වල අවධානම්වලින් 20% ක් ද ජාතික රක්ෂණ භාර අරමුදල මගින් අන්තර්ග්‍රහණය කරගනී. එම නිසා, 2011 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයෙන් සාමාන්‍ය රක්ෂණ ග්‍රහණය කර ගැනීමේ ප්‍රතිශතය 0.66% ක් විය.

# 5.2. කාර්යසාධන සමාලෝචනය


## හය වසරක මූල්‍ය සමාලෝචනය

ප්‍රස්ථාරය 5.01: උපයන ලද ශුද්ධ පසුකාලීන (ප්‍රවණතාවය)





උපයන ලද ඒකාබද්ධ ශුද්ධ වාරික ආදායම 2009 වන තෙක් වර්ෂ 04 ක් අඛණ්ඩව වර්ධනය වීමේ ප්‍රවණතාවක් වාර්තා විය. ඉන්පසු 2011 වනතෙක් එය අඩුවෙමින් සහ ස්ථාවර වෙමින් පැවතිණි.

ප්‍රස්ථාරය 5.02: ශුද්ධ ලාභයේ පසුකාලීන ප්‍රවණතාවය





ශුද්ධ ලාභය මගින් 2009 වර්ෂය වන තෙක් වර්ෂ 04 ක් තුළ වැඩිවීමේ වර්ධනය ගොනු කර ඇත. ඉන් පසු ත්‍රස්තවාදී ආවරණය සඳහා පැවති ඉල්ලුම පහත වැටීම හේතුවෙන් 2010 දී ශුද්ධ ලාභය සැලකිය යුතු පහත වැටීමක් පෙන්නුම් කරයි. 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී එය 7% කින් පහත වැටී ඇත.

ප්‍රස්ථාරය - 5.03; සමුච්චිත අරමුදලේ පසුකාලීන ප්‍රවණතාවය





සමුච්චිත අරමුදල 2010 වන තෙක් රු. මිලියන 9695 ක් දක්වා වර්ධනය වී ඇතත් 2010 වර්ෂයට සාපේක්ෂව 2011 වර්ෂයේදී එය 12% කින් පහත වැටී ඇත.

ප්‍රස්ථාරය - 5.04; ආයෝජන මිල පසුකාලීන ප්‍රවණතා




ආයෝජනය 2010 වන තෙක් ඉහළ යෑමේ ප්‍රවණතාවක් දක්නට ඇත. ඉන්පසු 2010 දී එය රු. මි. 5574 ක් දක්වා පහත වැටී ඇති අතර 2011 දී එය 2010 ට සාපේක්ෂව සුළු ප්‍රමාණයකින් පහත වැටී ඇත.


<u>ප්‍රස්ථාරය - 5.05: පරිපාලන වියදම්වල පසුකාලීන ප්‍රවණතාව</u>




පරිපාලන වියදම්වල 2010 වන තෙක් උච්ඡාවචන වර්ධන ප්‍රවණතාවක් දක්නට ලැබේ. 2010 දී එය තරමක් පහත වැටී ඇති අතර 2011 දී එය උපරිම අගයක් ගෙන ඇත.

# 5.2.2 ද්‍රවශීලතාවය සහ නුබුන්වත් බව විශ්ලේෂණය

**ප්‍රස්ථාරය 5.06 :ද්‍රවශීලතාව**





පවත්නා අනුපාතයකින් මනිනු ලබන්නා වූ ජා.ර.භා.අ. ද්‍රවශීලතා තත්ත්වය සැලකිල්ලට ගැනීමේදී 2008 සිට 2011 දක්වා වර්ෂ 4 ක කාලය තුළ පවත්නා අනුපාතය දෙගුණයකින් වර්ධනය වී ඇති බව පැහැදිලිය. හිමිකම් ගෙවීමේ අවශ්‍යතා වල ක්ෂණික ඉහළ යාමක් සඳහා වන ජා.ර.භා.අ. ප්‍රබල හැකියාව පසුගිය වසර 4 ක කාලය තුළ ද්‍රවශීලතා තත්ත්වයේ වර්ධනය මගින් පෙන්නුම් කෙරේ.


2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ විධි විධානප්‍රකාරව, අතිරික්ත මුදල්,අවදානම් රහිත රජයේ සුරකුම්පත්වල (භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත් සහ ආදිය) මිල ආයෝජනය කළ යුතුය. 2011 වර්ෂයේදී, රුපියල් බිලිය 8.5 වන මුළු සමුච්චිත අරමුදලෙන්, රුපියල් බිලියන 7.7 ක වටිනාකමකින් යුතු රජයේ සුරකුම් (භාණ්ඩාගාර බැඳුම්කර, භාණ්ඩාගාර බිල්පත්, ආර්ර්පීඕ, සහ කම්කරු මගින් ද්‍රවශීල මූල්‍ය වත්කම් නියෝජනය කරකයි. ද්‍රවශීලතාවය ඉහළ ලැංවීමට සහ ආර්ජ්එම් ශාස්තු ඇගයීමේ AAA ලබාගැනීමට එම තත්ත්වය පාදක වී ඇත.

**නුබුන්වත් උපානත විශ්ලේෂණය**

**ප්‍රස්ථාරය 5.07: නුබුන්වත් අනුපාතය විශ්ලේෂණය**



ප්‍රස්ථාරය 5.08 නුබුන්වත් උපානත විශ්ලේෂණය




වගුව 5.01 :නුබුන්වත් බව විශ්ලේෂණය

| | 2010 (රු. 000) | 2011 (රු. 000) |
|---|---|---|
| ප්‍රවේශ විය හැකි වත්කම් (රු. 000) | 5,927,832 | 4,508,449 |
| මුළු වගකීම් ප්‍රමාණය (රු.000) | 1,454,657 | 1,447,488 |
| 2.1 තාක්ෂණික සංචිත - ශුද්ධ (දළ) සෘණ ප්‍රතිරක්ෂණ) (රු. 1000) | 681,820 | 801,957 |
| 3.2 අනෙකුත් වගකීම් (රු. 1000) | 772,837 | 645,530 |
| පවත්නා නුබුන්වත් උපානනය (රු. 000) | 4,473,175 | 3,060,961 |
| අවශ්‍යවූ නුබුන්වත් උපානනය | 740,242 | 749,649 |

හිමිකම්පෑම් ඇතිවන අවස්ථාවකදී ගෙවීමට ඇති හැකියාව, ඒ සඳහා වන සමාගමේ ද්‍රවශීලතාවය නුබුන්වත් උපානිතය මගින් මනිනු ලබයි. නුබුන්වත් අනුගතය යනු නුබුන්වත් උපානතය, අවශ්‍ය ප්‍රමාණයට පවත්නා නුබුන්වත උපානත ප්‍රමාණයේ අනුපාතය වේ.

ඉහත ප්‍රස්තාරය අනුව 2010 සහ 2011 වර්ෂවල පවත්නා නුබුන්වත් උපාන්තය අවශ්‍ය නුබුන්වත් උපානතයට වඩා ඉහළින් පවතී.

ඉහත නුබුන්වත් උපානත ප්‍රවනතා විශ්ලේෂණ ප්‍රස්තාරය සහ නුබුන්වත් අනුපාත ප්‍රවනතා විශ්ලේෂණ ප්‍රස්තාරය මගින් ජා.ර.භ.අ. යහපත් නුබුන්වත් තත්ත්වය පෙන්නුම් කරයි.

**<u>අවම ප්‍රාග්ධන අවශ්‍යතා විශ්ලේෂණය</u>**

2009 වර්ෂයේදී, ලෝක බැංකුවේ සහයෝගය ඇතිව ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය ශ්‍රී ලංකා රක්ෂණ අංශය සඳහා අවධානම් සංවර්ධනය වහා මිල වෙනස්වන සුළු අවම ප්‍රාග්ධන පාලනය කිරීමට රක්ෂණ කර්මාන්තය අධීක්ෂණය සඳහා වන අවම ප්‍රාග්ධන මොඩලය ( model) උරදෙන ලදි. ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නියම කරනු ලැබූ රෙගුලාසි වලට අනුව ලියා පදිංචිය අපේක්ෂා කරන සමාගමක් විසින් සපුරාලිය යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සමාලෝචන වර්ෂය තුළ රක්ෂණ ව්‍යාපාර පන්තියක් (රුපියල් මිලියන500 ක් දක්වා ඉහළ නංවන ලදි. 2011 වර්ෂය අවසානවන විට ජා.ර.භාර අරමුදල විසින් ජා.ර.භාර අ. මණ්ඩලයේ අරමුදල රුපියල් මිලියන 8515 ක් වාර්තා කර ඇති බැවින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් පනවා ඇති රෙගුලාසිවලට අනුව අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය සපුරා ඇත.

## 5.2.3 මූල්‍ය කාර්යසාධනය - 2011

අරමුදලේ ප්‍රමුඛ කාර්යයන්ට අදාලව 2011 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හි පෙන්නුම් කරන සාරාංශගත ආදායම් හා වියදම් සංඛ්‍යා විවිධ අංශ යටතේ වර්ගීකරණය කරන ලදුව පහත 3.1 - 3.3 වගුව තුළ දක්වා ඇත.

2011 වර්ෂය තුළදී අග්‍රහාර සාමාජිකයන් වෙතින් ලැබුන රක්ෂණ වාරික ආදායම රුපියල් මිලියන 623 කි. 2010 වසරට සාපේක්ෂව රුපියල් මිලියන 28 කින් වැඩිවී ඇති අතර ඊට අනුරූපව මෙම රක්ෂණ භාරයට භාණ්ඩාගාරයෙන් සැපයිය යුතු දායක මුදල ද වැඩි වී ඇත. එසේම සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන ලද හිමිකම්පෑම් වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රුපියල් මිලියන 1,235 ක් පිරිනමන ලද අතර, එම ප්‍රමාණය 2010 වර්ෂයට වඩා 15% ක වැඩිවීමකි.

2011 වර්ෂය අවසානයේදී රජයේ සුරැකුම්පත්වල මූල්‍ය ආයෝජනය රුපියල් මිලියන 4,444 කි. පොළී අනුපාතය පහළ යාම හේතුවෙන් 2011 වර්ෂය තුළ උපයනු ලැබූ පොළී මුදල සාපේක්ෂව අඩුවිය. ද්‍රවශීලතා අවධානමට නිසි අවධානය යොමු කරමින් ආයෝජන කළඹ කළමනාකරණය කර ඇත.

<u>5. 02 වගුව: රක්ෂණ වාරික ආදායමේ කාණ්ඩ අනුව වර්ගීකරණය</u>

| කාණ්ඩය | 2011<br>එකතුව (රු.) | 2010<br>එකතුව (රු.) |
|---|---|---|
| **<u>01. රක්ෂණ වාරික ශුද්ධ ඉපයීම</u>** - | | |
| සාමාජිකයන්ගේ දායකවීම | **623,424,037** | 595,140,400 |
| භාණ්ඩාගාර දායකත්වය | **494,229,000** | 442,790,000 |
| වාරික ආදායම - මෝටර් රථ | **215,199,457** | 237,386,267 |
| වාරික ආදායම - ප්‍රතිරක්ෂණ | **198,551,912** | 296,078,296 |
| වාරික ආදායම - පාර්ලිමේන්තු මන්ත්‍රීවරු | **10,000,000** | 10,000,000 |
| වාරික ආදායම - විදේශ රැකියා | **208,799,952** | 231,968,216 |
| වාරික ආදායම (පොදු රක්ෂණය) ගිනි, මුහුදු සහ වෙනත් | **170,876,837** | 149,796,387 |
| දළ ලිඛිත ආදායම - වැඩ වර්ජන, කලකෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදල | **2,006,556,886** | 1,874,425,103 |
| වාරික ආපසු ගෙවීම | **(26,080)** | (4,194,863) |
| **දළ ලිඛිත වාරිකය** | **3,927,612,001** | 3,833,389,806 |
| ප්‍රතිරක්ෂණ වාරිකය | **(179,367,937)** | (132,180,421) |
| **ශුද්ධ ලිඛිත ආදායම** | **3,748,244,064** | 3,701,209,385 |
| නොඉපයිවූ වාරික සඳහා වන සංචිතවල ශුද්ධ වෙනස | **(141,879,032)** | 225,260,471 |
| ශුද්ධ ඉපයූ වාරික | **3,606,365,031** | 3,926,469,856 |

5.03 වගුව: රක්ෂණ හිමිකම්පෑම් මත වියදම් කාණ්ඩ අනුව වර්ගීකරණය

| කාණ්ඩය | එකතුවේ ප්‍රතිශතයක් ලෙස (2011) | 2011 එකතුව (රු) | 2010 එකතුව (රු) |
|---|---|---|---|
| ඇස්කණ්ණාඩි - අග්‍රහාර | 10 | **180,748,334** | 171,198,748 |
| පුද්ගලික රෝහල් ගාස්තු - අග්‍රහාර | 32 | **592,182,669** | 497,586,183 |
| දරු උපත් - අග්‍රහාර | 6 | **106,577,025** | 92,391,681 |
| හදිසි අනතුරු - අග්‍රහාර | 1 | **21,702,772** | 21,090,442 |
| වෛද්‍ය ගාස්තු - අග්‍රහාර | 1 | **23,382,718** | 33,195,607 |
| හෘද - අග්‍රහාර | 7 | **136,497,358** | 118,423,376 |
| පිළිකා - අග්‍රහාර | 1 | **11,265,221** | 25,415,064 |
| සාමාන්‍ය සහ හදිසි අනතුරකින් ජීවිතක්ෂයට පත්වීම - අග්‍රහාර | 9 | **162,837,751** | 117,405,559 |
| මෝටර් රථ හිමිකම් | 7 | **127,633,818** | 151,555,078 |
| විදේශ රැකියා | 10 | **182,688,549** | 160,963,358 |
| ප්‍රතිරක්ෂණය වියදම් | 3 | **58,145,811** | 202,732,501 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය රක්ෂණය | 1 | **9,419,785** | 6,951,417 |
| පොදු වෛද්‍ය රක්ෂණය | 5 | **96,419,651** | 10,598,492 |
| ශුද්ධ හිමිකම්පෑම -SRCC & Tr. | -8 | **(141,693,868)** | 303,486,061 |
| ශුද්ධ කොමිස් මුදල | 17 | **311,679,100** | 379,079,417 |
| | 100 | **1,879,486,696.15** | 2,292,072,983 |

5.04 වගුව : රක්ෂණ වාරික වර්ගීකරණය හා වැඩවර්ජන, කලකෝලාහල, සිවිල් කැළඹිලි හා ත්‍රස්තවාදී අරමුදල

| සමාගම | රක්ෂණ වාරික ආදායම් එකතුව(දළ)(රු) | | හිමිකම් ගෙවීම (රු.) | |
|---|---|---|---|---|
| | 2010 | 2011 | 2010 | 2011 |
| සී/ස එම්.බී.එල්.සී. රක්ෂණ සමාගම | 11,551,010 | 21,394,755 | - | - |
| එලයන්ස් රක්ෂණ සමාගම පී.එල්.සී | 68,083,011 | 89,445,031 | | - |
| අමානා තකාෆුල් රක්ෂණ සමාගම පී.එල්.සී | 26,539,015 | 38,248,905 | 840,607 | 43,405 |
| ඒසියන් එලයන්ස් රක්ෂණ සමාගම පී එල් සී | 36,060,690 | 42,765,121 | - | 1,216,358 |
| සෙලින්කෝ රක්ෂණ සමාගම පී එල් සී | 471,436,563 | 459,865,307 | 14,843,143 | 12,525,576 |
| සී/ස සමූපකාර රක්ෂණ සමාගම | 14,425,924 | 16,895,115 | - | - |
| අවිවා එන් ඩී බී රක්ෂණ සමාගම පී එල් සී | 187,046,028 | 170,354,272 | 8,966,337 | - |
| සී/ස චාර්ටිස් රක්ෂණ සමාගම | 39,058,901 | 36,501,160 | 500,000 | - |
| එච් එන් බී ඇෂුවරන්ස් සමාගම පී එල් සී | 88,708,547 | 89,839,459 | 558,000 | 1,408,454 |
| ජනශක්ති රක්ෂණ සමාගම පී එල් සී | 194,713,355 | 219,736,741 | 92,791,315 | 96,104,560 |
| සී/ස සණස රක්ෂණ සමාගම | 4,826,003 | 4,890,450 | | - |
| ශ්‍රී ලංකා රක්ෂණ සමාගම | 376,745,497 | 399,562,281 | 285,021,380 | 82,377,448 |
| යූනියන් ඇෂුවරන්ස් සමාගම පී එල් සී | 236,695,822 | 235,607,663 | 38,796,018 | 869,977 |
| සීමාසහිත පීපල්ස් රක්ෂණ සමාගම | 85,054,399 | 128,470,573 | 510,370 | 6,275,383 |
| සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 23,901,086 | 39,610,697 | | - |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 6,861,462 | 6,017,775 | 449,191 | - |
| සීමාසහිත එල් ඕ සී එල් සී රක්ෂණ සමාගම | - | 6,677,674 | | - |
| සීමාසහිත ඔරියන්ට් රක්ෂණ සමාගම | - | 62,733 | | - |
| | | | | |
| | **1,874,425,103** | **2,005,945,712** | **304,594,775** | **200,821,161** |

5.05 වගුව: වාරික ආදායමේ දායකත්වය

*(සියළුම සංඛ්‍යා ලංකා මුදල් වලින්)*

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| **වාරික ආදායම** | | | | | |
| සාමාජිකයින්ගේ දායක වීම | 578,628,923 | 595,339,833 | 573,518,510 | 595,140,400 | 623,424,037 |
| භාණ්ඩාගාරයේ දායකත්වය | 346,711,759 | 480,000,000 | 440,380,000 | 442,790,000 | 494,229,000 |
| වාරික ආදායම - මෝටර් රථ | | 130,018,979 | 244,352,905 | 237,386,267 | 215,199,457 |
| වාරික ආදායම ප්‍රතිරක්ෂණ | | 341,170,103 | 473,434,837 | 296,078,296 | 198,551,912 |
| වාර්ෂික ආදායම - පාර්ලිමේන්තු සාමාජිකයින් | | 30,000,000 | 15,408,460 | 10,000,000 | 10,000,000 |
| වාරික ආදායම - විදේශ රැකියා | | 118,428,753 | 200,483,864 | 231,968,216 | 208,799,952 |
| වාරික ආදායම පොදු රක්ෂණය | | | 194,237 | 149,796,387 | 170,876,837 |
| දළ ලිඛිත ආදායම වැඩ වර්ජන කළකෝලාහල | 2178,012,010 | 2,317,492,759 | 2 , 420,345,104 | 874,425,103 | 2,006,556,886 |
| **මුළු වාරික ආදායම** | 3,103,352,692 | 4,012,450,427 | 4,368,117,916 | 3,837,584,670 | 3,927,638,080 |

## වගුව 5.06: ශාඛාවල ඵලදායිතා විශ්ලේෂණය

| ආදායම | හම්බන්තොට ශාඛාව සමුච්චික 2011 | මාසික සාමාන්‍ය | අනුරාධපුර ශාඛාව සමුච්චිත 2011 | මසක සාමානා |
|---|---|---|---|---|
| මෝටර් රථ | 5,015,702 | | 9,014,188 | 751,182 |
| මෝටර් රථ නොවන | 5,526,498 | | 715,771 | 59,648 |
| ***දළ ආදායම්*** | **10,542,200** | **878,517** | 9,729,959 | 810,830 |
| ***(අඩුකළා) හිමිකම් පෑම්*** | | | | |
| මෝටර් රථ | **(165,376)** | **(13,781)** | (168,813) | (14,068) |
| ***ශුද්ධ ආදායම්*** | **10,376,824** | **864,735** | 9,561,146 | 796,762 |
| ***පොදු කාර්ය වියදම්*** | | | | |
| බදු කුලිය | (668,800) | (55,733) | (345,000) | (28,750) |
| විදුලිය | (25,886) | (2,157) | (99,665) | (8,305) |
| ජලය | (8,432) | (703) | (23,204) | (1,934) |
| වැටුප් සහ පඩි | (1,897,448) | (158,121) | (1,433,184) | (119,432) |
| දුරකථන - ස්ථාවර | (130,626) | (10,886) | (61,824) | (5,152) |
| දුරකථන - ජංගම | (26,250) | (2,188) | (21,454) | (1,788) |
| වාහන දීමනාව | (360,000) | (30,000) | (375,000) | (31,250) |
| ගමන් වියදම් | (18,447) | (1,537) | - | - |
| සුළු මුදල් වියදම් | (109,154) | (9,096) | (94,340) | (7,862) |
| නියෝජිත කොමිස් මුදල | (90,224) | (7,519) | (5,962) | (497) |
| ශාඛා මෙහෙයුම් වියදම් | (260,050) | (21,671) | - | - |
| තක්සේරු ගෙවීම් | - | - | (15,788) | (1,316) |
| ප්‍රවාහන | (15,000) | (1,250) | - | - |
| කාර්යාල උපකරණ | - | - | (12,200) | (1,017) |
| විවිධ වියදම් | - | - | (40,090) | (3,341) |
| ***මුළු වියදම්*** | **(3,610,317)** | **(300,860)** | (2,527,711) | (210,643) |
| ***ලාභය /( පාඩුව)*** | **6,766,507** | **563,876** | 7,033,435 | 586,120 |

# 5.2.4 භෞතික කාර්යසාධනය -2011

වගුව - 5.07: **අග්‍රහාර වියදම් වර්ගීකරණය 2011**

**(ගණනින්)**

| හිමිකම් වර්ගය | හිමිකම්පෑම් එකතුව | ගෙවන ලද හිමිකම්පෑම් | ගෙවීමට ඇති හිමිකම්පෑම් | ප්‍රතික්ෂේප කරන ලද හිමිකම්පෑම් |
|---|---|---|---|---|
| ජීවිතක්ෂයට පත්වීම් | 1,705 | 1,512 | 143 | 48 |
| අංගවිකල | 975 | 800 | 107 | 68 |
| දරු උපත් | 10,830 | 9,554 | 1,052 | 224 |
| පිළිකා | 583 | 532 | 26 | 25 |
| හෘද | 560 | 543 | 9 | 8 |
| ඇස් කණ්නාඩි | 60,189 | 52,460 | 2,503 | 5,226 |
| වෙනත් රජයේ රෝහල් ගාස්තු | 30,397 | 26,795 | 2,388 | 1,214 |
| වෙනත් පුද්ගලික රෝහල් ගාස්තු | 17,194 | 13,191 | 1,751 | 2,252 |
| වකුගඩු | 72 | 68 | 1 | 3 |
| අංශභාගය | 20 | 17 | - | 3 |
| **එකතුව** | **122,525** | **105,472** | **7,980** | **9,073** |

වගුව 5.08: මෝටර් වාහන රක්ෂණ ප්‍රතිරක්ෂණය කිරීමේ රක්ෂණ ඔප්පු වර්ගීකරණය - 2011

| කාණ්ඩය | 2011 | | | | | | | | | | | | මුළු එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | තුන්වන පාර්ශ්වය | | | | | | පරිපූර්ණ ආවරණය | | | | | | | |
| | රජය | | පෞද්ගලික | | | | රජය | | පෞද්ගලික | | | | | |
| | වාහන සංඛ්‍යාව | මුදල (රු) | වහෙන සංඛ්‍යාව | මුදල (රු) | වාහන සංඛ්‍යාව | මුදල (රු.) | වාහන සංඛ්‍යාව | මුදල (රු.) | වාහන සංඛ්‍යාව | (මුදල රු.) | වාහන සංඛ්‍යාව | (රු.) | වාහන සංඛ්‍යාව | මුදල (රු.) |
| ට්‍රැක්ටර් | 214 | 286,340 | 23 | 15,250 | 237 | 301,590 | 345 | 1,648,728 | 30 | 169,225 | 375 | 1,817,954 | 612 | 2,119,543 |
| පුද්ගලික මෝටර්රථ | 342 | 257,954 | 858 | 420,550 | 1,200 | 678,504 | 2,501 | 112,489,192 | 126 | 4,492,119 | 2,627 | 116,981,311 | 3,827 | 117,659,814 |
| මෝටර් සයිකල් | 262 | 90,889 | 1,418 | 613,152 | 1,680 | 704,041 | 1,911 | 8,259,927 | 59 | 430,410 | 1,970 | 8,690,337 | 3,650 | 9,394,378 |
| මෝටර් කෝච්චි | 66 | 99,448 | 8 | 9,274 | 74 | 108,722 | 421 | 12,714,907 | 5 | 104,477 | 426 | 12,819,384 | 500 | 12,928,106 |
| ලොරි රථ ඉඩම් වාහන | 468 | 624,303 | 37 | 44,094 | 505 | 668,397 | 1,028 | 14,551,019 | 55 | 1,561,326 | 1,083 | 16,112,345 | 1,588 | 16,780,742 |
| ලොරි ට්‍රේලරය | 242 | 42,151 | | | 242 | 42,151 | | | | | | - | - 242 | 42,151 |
| ද්විත්ව කාර්ය වාහන | 466 | 350,935 | 72 | 43,594 | 538 | 394,528 | 2,295 | 69,352,754 | 45 | 822,779 | 2,340 | 70,175,533 | 2,878 | 70,570,062 |
| 4W ට්‍රැක්ටර් සහ ට්‍රේලර් ගිලන්රථ/අවමංගල රථ | 3 | 3,474 | | | 3 | 3,474 | | | | | | - | - 3 | 3,474 |
| වෑන | 1 | 1,505 | | | 1 | 1,505 | 3 | 55,226 | | | 3 | 55,226 | 4 | 56,731 |
| ට්‍රේඩ් ප්ලේට් | 3 | 5,563 | 2 | 2,596 | 5 | 8,159 | 2 | 4,526 | 2 | 77,060 | 4 | 81,586 | 9 | 89,745 |
| ට්‍රේලරය | | | 32 | 14,760 | 32 | 14,760 | 308 | 853,315 | 6 | 248,248 | 314 | 1,101,563 | 346 | 1,116,323 |
| එකතුව | 2,067 | 1,762,561 | 2,450 | 1,163,270 | 4,517 | 2,925,831 | 8,469 | 219,929,593 | 328 | 7,905,644 | 8,797 | 227,835,238 | 13,314 | 230,761,069 |

වගුව 5.09: ගෙවන ලද මෝටර් රථ රක්ෂණ හිමිකම්පෑම් වර්ගීකරණය - 2011

| | 2011 | | | | | |
|---|---|---|---|---|---|---|
| | පරිපූර්ණ ආවරණය | | | | | |
| | රජය | | පෞද්ගලික | | එකතුව | |
| | හිමිකම්පෑම් සංඛ්‍යාව | මුදල (රු.) | හිමිකම්පෑම් සංඛ්‍යාව | මුදල (රු.) | හිමිකම්පෑම් සංඛ්‍යාව | මුදල (රු.) |
| ට්‍රැක්ටර් | 4 | 63,136 | | | 4 | 63,136 |
| පුද්ගලික මෝටර් රථ | 575 | 46,802,545 | 28 | 1,102,240 | 603 | 47,904,785 |
| මෝටර් සයිකල් | 39 | 656,210 | 6 | 86,323 | 45 | 742,533 |
| මෝටර් කෝච්චි | 79 | 10,291,531 | | | 79 | 10,291,531 |
| ලොරි රථ/ඉඩම් වාහන | 92 | 13,235,926 | 8 | 863,383 | 100 | 14,099,309 |
| ලොරි ට්‍රේලරය | | | | | | - |
| ද්විත්ව කාර්යය වාහන | 366 | 30,293,124 | 13 | 894,548 | 379 | 31,187,672 |
| වෑන් | 1 | 61,550 | | | 1 | 61,550 |
| ට්‍රේඩ් ප්ලේට්(Trade Plate) | | | | | | - |
| ට්‍රේලරය | | | | | | - |
| | | | | | | - |
| එකතුව | 1,156 | 101,404,021 | 55 | 2,946,494 | 1,211 | 104,350,515 |

# වගුව - 5.10: පොදු රක්ෂණ ඔප්පු වර්ගීකරණය

## රක්ෂණ ඔප්පු සාරාංශය

| | | 2011 | | |
|---|---|---|---|---|
| **රක්ෂණ ඔප්පු කාණ්ඩය** | | **රක්ෂණ ඔප්පු සංඛ්‍යාව** | **හිමිකම් සංඛ්‍යාව** | **හිමිකම් ප්‍රමාණය (රු.)** |
| ගිනි රක්ෂණය | | 35 | 6 | 2,812,010.45 |
| මුහුදු රක්ෂණය | | 138 | 4 | 509,871.08 |
| පුද්ගල හදිසි අනතුරු | විවිධ | 44 | - | **39,645,337.73** |
| කම්කරු වන්දි | | | | |
| ගෙවල් බිඳීම් | | 25 | 75 | |
| මාර්ගස්ථ මුදල් | | 4 | - | |
| විද්‍යුත් උපකරණ | | 18 | 1 | |
| කොන්ත්‍රාත්කරුවන්ගේ | | 7 | 1 | |
| සියලු අවධානම් | | 15 | 1 | |
| දේපල පිරියත සහ උපකරණ | | 30 | 7 | |
| වෛද්‍ය | | 17 | 6342 | 52,590,723.65 |
| **එකතුව** | | **333** | **6437** | **95,557,942.91** |

# ව්‍යාපාරික විමර්ශනය- අග්‍රහාර වෛද්‍ය රක්ෂණය පිළිබඳ සමාලෝචනය



අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය, රාජ්‍ය පරිපාලනඅමාත්‍යාංශ චක්‍රලේඛ අංක 12/2005 මගින් හඳුන්වා දෙනු ලැබූ අතර 2006 ජනවාරි මස 01 වැනි දින සිට මෙම යෝජනා ක්‍රමය විවාහක සේවකයන්ගේ - සාමාජිකයා, කලත්‍රයා සහ ළමයින් (අවිවාහක, රැකියාවක් නොකරන සහ වයස අවුරුදු 21 ට අඩු තැනැත්තන් පමණක්) සහ අවිවාහක සේවකයන් - සාමාජිකයා දෙමාපියන් (වයස අවුරුදු 70 ට අඩු දෙමාපියන් නම් පමණක්) ගේ යහපත වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක වේ.

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය, රාජ්‍ය සේවකයන්ගේ සහ පළාත් රාජ්‍ය සේවකයන්ගේ මෙන්ම ඔවුන්ගේ පවුල්වල ජීවන තත්ත්වය නගා සිටුවීම පිණිස ස්ථාපිත කර ඇත. එම නිසා අපට ලැබෙන සියළුම හිමිකම් පෑම් වලට හැකි ඉක්මනින් කඩිනමින් ගෙවීම සඳහා අප විසින් පියවර ගෙන ඇත.

ප්‍රමාදයකින් තොරව, හිමිකම්පෑම් ගෙවීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම පිණිස E කාඩ්පත් ක්‍රමය ක්‍රියාත්මක කිරීමෙන් පසු ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නව හිමිකම්පෑම් සකස් කිරීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කර ඇත. E කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීමෙන් අනතුරුව සියළුම අත්‍යාවශ්‍ය අවශ්‍යතා සම්පූර්ණ කරනු ලබන අග්‍රහාර හිමිකම්පෑම් දැනුම්දීම වැඩකරන දින 03 ක් ඇතුලත ගෙවා ඇත.

2011 වර්ෂයේදී චක්‍රලේඛය ප්‍රකාරව රජයේ නිලධාරීන්ගේ මාසික වැටුපෙන් මසකට රු.75ක් මූල්‍ය දායකත්වයක් මෙම යෝජනා ක්‍රමයට අඩුකර ගන්නා ලදි. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලිකරණය කරන තුරුම මෙම රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබුවේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසිනි. මෙම රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ, පහත සඳහන් රක්ෂණ ප්‍රතිලාභ පිරිනමනු ලැබේ.

**1.** රෝහල් ගාස්තු වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ

මෙම ප්‍රතිලාභ යටතේ රෝහල්, හෙද නිවාස අයකිරීම්, වෛද්‍ය සහ ශල්‍යකර්ම සඳහා වන වියදම්, වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා ගෘහස්ථ ප්‍රතිකාර යනාදිය සඳහා වන ගාස්තු සපයනු ලැබේ.

**2.** උපැස් මිලදී ගැනීම

මෙම යෝජනා ක්‍රමය යටතේ වසර 03 කට වරක් උපැස් මිලදී ගැනීම සඳහා යන වියදම පියවා ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රු. 3500 ක මුදලක් සාමාජිකයන් වෙත පිරිනමයි.


**3.** ණය සුරැකුම් ණය යෝජනා ක්‍රමය

ඕනෑම අසනීප තත්ත්වයකදී හෝ සම්පූර්ණ හෝ අර්ධ වශයෙන් හෝ ආබාධිත තත්ත්වයකදී මාසික ආදායම මෙන් දස ගුණයක් මෙම ණය යෝජනා ක්‍රමය මගින් සපයනු ලබන අතර අදාල පුද්ගලයාගේ ජීවිතය හෝ රැකියාව අහිමි වුවහොත් නොගෙවූ මුදල් ප්‍රමාණය මෙමගින් ගෙවනු ලබයි.

අග්‍රහාර රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ 2011 වර්ෂය සඳහා වන මාසික හිමිකම් පෑම්, දායකත්වය (රජයේ දායකත්වය සහ අතිරික්තයට අදාළ දත්ත) පහත දැක්වේ.

<u>**සටහන - 5-09: අග්‍රහාර රක්ෂණය**</u>

<u>**අතිරික්තය, දායකත්වය හිමිකම්පෑම්**</u>



# මෝටර් වාහන රක්ෂණය පිළිබඳ සමාලෝචනය



ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතනයන්ට, යෝජනා පත්‍රය සම්පූර්ණ කිරීමේ හා වාරික ගෙවීම මත එක් දිනක් තුළ මෝටර් වාහන රක්ෂණය පිළිබඳ සෑම රක්ෂණ ඔප්පුවක්ම නිකුත් කරනු ලබයි. රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේදී සහ හිමිකම් ගෙවීමේදී පාරිභෝගිකයන්ට ඉතා ඉහළ පහසුකම් සපයමින් හදිසි අනතුරක් සිදුවන අවස්ථාවක ජාතික රක්ෂණභාර අරමුදල විසින් පූර්ණ වගකීම දරනු ලබයි.

ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවාලීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයන්ට අයත් වාහන (වෛකල්පිත) සහ අර්ධ-රාජ්‍ය ආයතනවලට අයත් වාහන (වෛකල්පිත) රක්ෂණය කිරීම උදෙසා 2011 අංක B/F 437 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මෝටර් වාහන රක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන ලදි. පෞද්ගලික කාර් රක්ෂණ ඔප්පු (පෞද්ගලික කාර්, ස්ටේෂන් වැගන් රථය, ජීප් රථය, ත්‍රීවීලර් යනාදිය) වාණිජමය වාහන (භාණ්ඩ ප්‍රවාහන වාහන, ගාස්තුවකට හෝ ප්‍රදානයකට මගීන් රැගෙන යාමේදී භාවිතා කරනු ලබන ද්විත්ව කාර්ය වාහන, බස් (කුලියට හෝ පෞද්ගලික) කෘෂිකාර්මික වාහන යනාදිය) සඳහා, යතුරු පැදි රක්ෂණ ඔප්පු (යතුරු පැදි, ස්කූටර්, මොපෙට් යතුරු පැදිය යනාදිය සඳහා)වැනි විවිධ වාහන කාණ්ඩ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් විවිධාකාර මෝටර් වාහන රක්ෂණ ඔප්පු පිරිනමයි.

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මෝටර් වාහන රක්ෂණ ඔප්පු නිකුත් කිරීමේදී පිරිනමනු ලබන මූලික රක්ෂණ වාරිකවලට අමතරව, ජල ගැලීම්, තෙවන පාර්ශ්ව දේපළ හානි, තීරුබදු රහිත නැවගත කිරීම්, පීජ්බී රියදුරු/ මගින්, වාරික ගෙවීමට භාණ්ඩ මිලදී ගැනීම, වා මල්ල,රක්ෂණාවරණය, ඇදගෙන යාමේ ගාස්තු, වාහන ඉදිරිපස වීදුරු රක්ෂණාවරණය, රියදුරු/ක්ලීනර්/සහායකයන් සඳහා වන ආධුනික රියදුරු රක්ෂණාවරණය ( WCI ) මගීන් මාර්ගස්ථ භාණ්ඩ, අන්තරායකාරී සහ අන්තරායකාරී නොවන භාණ්ඩ (යතුරු පැදි හා ත්‍රස්තවාදී (යතුරු පැදි) වෙනුවෙන් නෛතික වගකීම ආධුනික රියදුරු ආවරණ, කුලියට ගැනීම බැහැර කිරීම, පෞද්ගලික හදිසි අනතුරු ප්‍රතිලාභ (රියදුරු සහ මගීන් සඳහා පෞද්ගලික මෝටර් රථ සඳහා වාණිජමය වාහන රියදුරු/ක්ලීනර්/සහායකයන් සඳහා SRCC/TC රක්ෂණාවරණය)


වාහනයක් විකුණන අවස්ථාවකදී එම වාහනයට අදාළ රක්ෂණ සහතිකය/රක්ෂණ ඔප්පුව වෙනත් අයට පැවරිය නොහැක.අවසන් නොවූ රක්ෂණ කාල පරිච්ඡේදයට අයත් රක්ෂණ වාරික ගෙවීමට (ණය) වාහනය නව අයිතිකරුට ඉඩ සලසා දෙන ලෙස ජාතික රක්ෂණ භාර අරමුදලට කරන ලිඛිත ඉල්ලීමක් සහිතව රක්ෂණයෙකු ස්වකීය වාහනය විකුණා ඇති අවස්ථාවකදී, ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වාරිකය නැවත ගණනය කිරීමේ පදනම මත නව අයිතිකරුගෙන් අළුත් යෝජනා පත්‍රයක් ඉල්ලා සිටිනු ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදලේ රක්ෂණ ඔප්පුවක්/රක්ෂණ සහතිකයක් රක්ෂණ ඔප්පුවේ කාල පරිච්ඡේදය අවසන්වීමේදී අළුත් කළ හැකිය. රක්ෂිත මුදල ද වාහනයේ වර්තමාන වෙළඳ පොල වටිනාකම පිළිඹිබු වන පරිදි වෙනස් කරනු ඇත.


රක්ෂණය කරනු ලැබූ වාහනය හදිසි අනතුරකට භාජනය වන අවස්ථාවකදී දැරීමට සිදුවූ හානි සඳහන් කරමින් හැකි ඉක්මනින් ලඟම ඇති පොලිස් ස්ථානයට ප්‍රකාශයක් කළ යුතුය. ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සලසනු ලබන මෝටර් වාහන රක්ෂණ ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ ඕනෑම ස්ථානයක ඕනෑම මොහොතක ඔහුගේ/ඇයගේ වාහනය මුහුණ දෙන්නා වූ පිළිගත් සියලුම අනතුරු වෙනුවෙන් පූර්ණ රක්ෂණාවරනයක් වාහන හිමියන්ට පිරිනමයි.

මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රමයේ කොටසක් යටතේ 2011 වර්ෂය තුළ වන හිමිකම්පෑම් වලට අදාළ මාසික මූල්‍ය ප්‍රවාහය සහ වාරික ඉපයීම් 5.10 සටහනින් දැක්වේ.

<u>සටහන 5-10: මෝටර් රථ රක්ෂණය ලාභය, වාරිකය සහ හිමිකම්පෑම්</u>



# ප්‍රතිරක්ෂණය පිළිබඳ සමාලෝචනය




ප්‍රතිතිරක්ෂණය යනු රක්ෂණ හිමිකම්පෑමක් නිසා ගෙවීමට සිදුවිය හැකි විශාල මුදලක් අඩුකර ගැනීම පිණිස ආකාර කීපයක එකඟතාවක් මගින් අවධානම් සහගත ආයෝජන අනෙක් පාර්ශවකරුවන්ට පැවරීමට කටයුතු කිරීම වේ.

රක්ෂණ සමාගම් ප්‍රතිරක්ෂණ ආවරණ ලබා ගැනීමට බලපාන ප්‍රධාන හේතූන් දෙකකි. පළමු හේතුව වන්නේ, සමාගමේ වත්කම්වල වටිනාකම වෙතින් අනුමත ප්‍රමාණයට වඩා විශාල පුද්ගලික අවධානමක් පවත්වා ගෙනයාම අත්‍යවශ්‍ය වීම සහ එමගින් සිදුවිය හැකි පාඩු වලක්වා රක්ෂණ ආයතනයට රැකවරණය සලසා දීමයි. එම නිසා සාමාන්‍ය රක්ෂණ සමාගම්වල මුළු වත්කම් වටිනාකමට වඩා ඉහළ ආරක්ෂණ සීමාවන් සැලසීමට එම රක්ෂණ සමාගම්වලට ප්‍රතිරක්ෂණය මගින් ඉඩ ලබා දෙයි. දෙවැනි හේතුව වන්නේ, අනාවැකි කීමේ හැකියාව මගින් විශාල අලාභයන් සහ ආවරණය සැපයීමට අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය අඩු කිරීම සඳහා රක්ෂණ සමාගම්වලට උපකාර කිරීමට ප්‍රතිරක්ෂණයට හැකියාවක් පැවතීමයි.


මෙම නිසා ශ්‍රී ලංකාවේ පවතින රක්ෂණ සමාගම් ඔවුන්ගේ ප්‍රතිපත්ති මගින් ලේඛනගත වටිනාකම් විදේශීය ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ආරක්ෂා කර ගනියි. ඒ නිසා ජාතික රක්ෂණභාර අරමුදලට ඇතැම් පහසුකම් පළාත්බඳව ලබාදීම තුළින් ආරක්ෂණයේ කොටසක් වීමට අවස්ථාවන් පවතී.

දේශීය සාමාන්‍ය රක්ෂණ වෙළඳපොලෙන් අනිවාර්ය ප්‍රතිරක්ෂණ කොටස ප්‍රතිග්‍රහණය කිරීමට 2007 දෙසැම්බර් මස 19 වැනි දිනැති අංක 1528/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රය මගින් ජාතික රක්ෂණ භාර අරමුදලට (**NITF**) බලය පවරන ලදි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික ගනුදෙනුවල නියැලෙන එක් එක් රක්ෂණ සමාගමක සාමාන්‍ය රක්ෂණ වැඩ සටහනෙන් (නිශ්චිතව සඳහන් කරනු ලබන විධි විධානයන්ට යටත්ව) අනිවාර්ය ප්‍රතිරක්ෂණ කොටස් වලින් 20% ක ප්‍රතිශතයක් රක්ෂණ භාර අරමුදල නියම කොට දක්වා ඇත. 2009 අගෝස්තු මස 20 වැනි දින අංක 1615/20 දරන අති විශේෂ ගැසට් පත්‍රය අනුව සෘජු සාමාන්‍ය රක්ෂණ ගනුදෙනු වල නියැලීමට ද ජාතික රක්ෂණ භාර අරමුදලට බලය පැවරී ඇත.

ඉහත කී දින සිට ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන්හි නියැලිය හැකි බලය ලත් එකම ආයතනය ජාතික රක්ෂණ භාර අරමුදල වේ. 2008 ජනවාරි මස 01 වැනි දින සිට සියලුම දේශීය රක්ෂණ සමාගම්වල 20% ක අනිවාර්ය ප්‍රතිරක්ෂණකොටස ප්‍රතිග්‍රහණය කර ගනිමින් ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණය ව්‍යාපාරයෙහි නියැලී සිටී. මෙලෙසින් ක්‍රියාකරමින් විදේශ විනිමයෙන් විශාල කොටසක් රට තුළ රඳවා ගැනීමට අරමුදල සමත් විය.

ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය වෙනුවෙන් 2011 වර්ෂය සඳහා වන මාසික හිමිකම් පෑම්, වාරිකය ප්‍රතිලාභ විශ්ලේෂණය පහත රූප සටහනෙන් දක්වා ඇත.

සටහන 5.11 : ප්‍රතිරක්ෂණ ලාභය, වාරිකය හිමිකම්පෑම්




**ප්‍රතිරක්ෂණ දළ ලේඛනගත වාරික ප්‍රභේදනය - 2011**

ප්‍රතිරක්ෂණය වෙතින් ලබාගත් දළ ලේඛනගත වාරබිඳ වැටීම පහත දැක්වෙන ආකාරයට විශ්ලේෂණය කර ඇත.

| දළ ලේඛනගත වාරික ප්‍රභේදනය -2011 | මුළු වාරිකය (රුපියල්)) |
|---|---|
| එම්.බී.එල්.සී. රක්ෂණ සමාගම පී එල් සී | 21,394,755 |
| සී/ස එලයන්ස් රක්ෂණ සසමාගම | 89,445,031 |
| අමානා තකාෆුල් රත්ෂණ සමාගම පී එල් සී | 38,248,905 |
| ඒසියන් එලයන්ස් රක්ෂණ සමාගම පී එල් සී | 42,765,121 |
| සෙලින්කෝ රක්ෂණ සමාගම පී එල් සී | 459,865,307 |
| සී/ස සමූපකාර රක්ෂණ සමාගම | 16,895,115 |
| අවිවා එන් ඩී බී රක්ෂණ සමාගම පී එල් සී | 170,354,272 |
| සී/ස වාර්ටිස් රක්ෂණ සමාගම | 36,501,160 |
| එච් එන් බී ඇෂුවරන්ස් සමාගම පී එල් සී | 89,839,459 |
| ජනශක්ති රක්ෂණ සමාගම පී එල් සී | 219,736,741 |
| සී/ස සණස රක්ෂණ සමාගම | 4,890,450 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 399,562,281 |
| යූනියන් ඇෂුවරන්ස් සමාගම පී එල් සී | 235,607,663 |
| සීමාසහිත පීපල්ස් රක්ෂණ සමාගම | 128,470,573 |
| සී/ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම | 39,610,697 |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 6,017,775 |
| සීමාසහිත එල් ඕ එල් සී රක්ෂණ සමාගම | 6,677,674 |
| සීමාසහිත ඔරියන්ට් රක්ෂණ සමාගම | 62,733 |
| | 2,005,945,712 |

# වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල පිළිබඳ සමාලෝචනය




ව්‍යවසනකාරී අලාභ (රුපියල් මිලියන 1600) ප්‍රමාණයකට හේතුවූ 1983 සිවිල් කලබලයට පසුව 1985 වර්ෂයේ සිට ස්වකීය ප්‍රතිරක්ෂණ සමාගම් විසින් නිෂ්චිත ව්‍යාපාර මට්ටම් වලදී වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සම්බන්ධයෙන් ආරක්ෂාව ප්‍රතික්ෂේප කිරීමේ අනපේක්ෂිත තත්ත්වයකට දේශීය රාජ්‍ය රක්ෂණ සමාගම් මලට මුහුණ දීමට සිදුවිය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා රජය විසින් අරමුදලින් නිශ්චිතව දක්වා ඇති එකී රක්ෂණ පංතිවල වැඩ වර්ජන කැරලිකෝලාහල සහ සිවිල් අරගල වෙනුවෙන්වන ආවරණය ඇතුළුව විස්තෘත රක්ෂණ ඔප්පු මත කරනු ලබන හිමිකම් පෑම් ගෙවීම සඳහා 1987 දී වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල නමින් හඳුන්වන අරමුදලක් ස්ථාපිත කරන ලදි.

වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල අරමුදල විසින් රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන වලට ආරක්ෂාව ලබා දෙයි.

අනතුරුව 1989 දී ත්‍රස්තවාදී කටයුතු උත්සන්න වීම නිසා, ශ්‍රී ලංකා රජය විසින් ත්‍රස්තවාදී ක්‍රියා සහ කඩාකප්පල්කාරී ක්‍රියා මගින් සිදුවන හානි/පාඩු නිසාවන අවදානම් ආවරණය ඇතුළත් කිරීම පිණිස වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල අරමුදල පුළුල් කරන ලදි. අවසානයේදී එම අරමුදල වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදය සඳහා වූ රජයේ අරමුදල යනුවෙන් නැවත නම වෙනස් කරන ලදි.

ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාවන් තුළ ඇතිවන්නා වූ වැඩවර්ජන, කැරලි කෝලාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාදී කටයුතු නිසා දේපළවලට වන පාඩුව/හානිය සසහ හෝ පුද්ගලයෙකුට සිදුවන මරණය/ශාරීරික තුවාල ආවරණය කිරීම සඳහා විස්තීර්ණවූ ශ්‍රී ලංකාවේ බලයලත් රක්ෂණ සමාගම් වන අරමුදලේ සියලුම සාමාජිකයින් විසින් නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු සඳහා අතිරේක රක්ෂණාවරණයක් පිරිනැමීමේ අරමුණින්, 1987 දී අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව වැඩවර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද රක්ෂණ අරමුදල පිහිටුවන ලදි. 1987 වර්ෂයෙන් ආරම්භවූ මෙම අරමුදල ජාතික රක්ෂණ සංස්ථාව විසින් කළමනාකරණය කර පවත්වාගෙන යන ලදි.

අනතුරුව 2003 වර්ෂයේදී සී/ස ජනශක්ති රක්ෂණ සමාගම විසින් ජාතික රක්ෂණ සංස්ථාව අත්පත් කර ගත් අතර පසුව වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සී/ස ජනශක්ති රක්ෂණ සමාගම විසින් පාලනය කරන ලදි.

2005 වර්ෂයේදී මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල සී/ස ජනශක්ති රක්ෂණ සමාගමෙන් ලබාගෙන පරිපාලනය කරන ලදි.

අවසානයේදී 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ18 (ඇ) වගන්තිය අනුව 2007 වර්ෂයේදී එකී වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට අන්තර්ග්‍රහනය කරන ලදි.

එසේ අන්තර්ග්‍රහණය කිරීමෙන් පසු එකී පනතේ 18 වන වගන්තිය (1) උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව අරමුදලට බැරකරන ලද සියලු මුදල් ජාතික රක්ෂණභාර අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට මාරුකරනු ලැබ ඇත. එම ගිණුම පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම

සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වරින් වර නිකුත් කරනු ඇත.

වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට අන්තර්ග්‍රහනය කිරීමට පෙර ගනු ලැබූ ක්‍රියා මාර්ග මාර්ගෝපදේශ නිකුත් කරන තුරු අඛණ්ඩව අනුගමනය කරන ලදි..


වැඩවර්ජන, කලකෝලාහල සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාද අරමුදලේ ප්‍රධාන කාර්යයන්

- රක්ෂණ සමාගම් හරහා වාරිකය අය කරගෙන අරමුදලට ප්‍රේෂණය කිරීම
- හිමිකම්පෑම් රක්ෂණ සමාගම් මගින් ගෙවීම සහ ක්‍රියාකාරී කමිටුවේ නිර්දේශය මත වැඩ වර්ජන, කළ කෝලාහල, සිවිල් කැළඹීම් සහ ත්‍රස්තවාද අරමුදලෙන් ප්‍රතිපූර්ණය කිරීම
- ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් හානියට පත් ආයතන වලට ප්‍රදානය කරන ලිහිල් කොන්දේසි මත ක්ෂය මුදල් ණය කළමනාකරණය මෙම ක්ෂය මුදල් පරිපාලනය කරනු ලබන්නේ ලංකා බැංකුව විසිනි.

2011 වර්ෂය සඳහා වැඩවර්ජන, කලකෝලාහල, ජන නැගිටීම් සහ ත්‍රස්තවාද අරමුදල වෙනුවෙන් වන මාසික හිමිකම් පෑම්, වාරික සහ ප්‍රතිලාභ විශ්ලේෂණය පහත දක්වා ඇත.

**<u>සටහන -5. 12: වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල විස්තිරණය</u>**

**<u>ලාභය, වාරිකය සහ හිමිකම් පෑම</u>**




★ ලාභය භාණ්ඩාගාර දායකත්වය අඩු කිරිමෙන් පසුවය

# සාමාන්‍ය රක්ෂණය පිළිබඳ විශ්ලේෂණය

ජාතික රක්ෂණ භාර අරමුදල පොදු රක්ෂණ කටයුතු ගිනි රක්ෂණය, මුහුදු උවදුරු රක්ෂණය විවිධ රක්ෂණ යෝජනා ක්‍රමය , සේවක වන්දි රක්ෂණය සහ වෛද්‍ය රක්ෂණය වශයෙන් ප්‍රධාන උප අංශවලට බෙදනු ලැබේ. 2009.08.20 වැනි දින නිකුත් කෙරුණු අංක 1615/20 දරණ ගැසට් නිවේදනය ප්‍රකාර මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ පිහිටුවන ලද අතර එය පසුගිය වර්ෂ කීපය තුළ නොවෙනස්ව වර්ධනය වී ඇත.

සාමාන්‍ය රක්ෂණය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගිනි රක්ෂණ ඔප්පු, මුහුදු උවදුරු රක්ෂණ ඔප්පුවක්, සේවක වන්දි රක්ෂණ ඔප්පු පිරිනමනු ලැබේ.



ජාතික රක්ෂණ භාර අරමුදලේ මුහුදු නැව් භාණ්ඩ රක්ෂණය මගින්, භාණ්ඩ රැගෙන යනු ලබන ආනයනකරුවන් අපනයනකරුවන් සහ මහා පරිමාන භාණ්ඩ ප්‍රවාහනය කරන්නන්ගේ අවශ්‍යතා සපුරාලනු ලබන අතර ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ජනතාවට වෙළඳාමේදී මුහුණ දීමට සිදුවන අවදානම් ද ආවරණය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවේ හෝ විදේශ රටවල සැපයුම්කරුවන් ගේ භාණ්ඩ ගබඩාවේ සිට භාණ්ඩ ප්‍රවාහනය කරනු ලබන කාලය තුළ දී රක්ෂණය කළ හැකි සෑම අවදානම් උවදුරු වෙනුවෙන් සියළුම භාණ්ඩ ආවරණය කරනු ලැබේ.

එක් වර්ෂයක් තුළ මුහුදු නැව් භාණ්ඩ ආවරණය කරනු ලබන විවෘත ආවරණ රක්ෂණයක් වශයෙන් හෝ තනි මුහුදු ගමන් රක්ෂණ ඔප්පුවක් වශයෙන් මෙම රක්ෂණ ආවරණය ගනුදෙනුකරුවන්ට ලබාගත හැක.

ජාතික රක්ෂණ භාර අරමුදලේ මුහුදු උවදුරු (නැව්බඳ) රක්ෂණ ඔප්පුවෙන් යාත්‍රා, කෙටි මුහුදු යාත්‍රා, වරාය හා ගංගා යාත්‍රා සියළුම මාදිලියේ පෞද්ගලික, විනෝද චාරිකා හා වාණිජ ප්‍රවාහන ගුවන්යානා සහ පෞද්ගලික ග්ලයිඩර් යානා, හෙලිකොප්ටර් යානා බිම් උපකරණ සහ වෙනත් යාත්‍රා වෙනුවෙන් රක්ෂණ ආවරණය සලකනු ලබන අතර, මෙය නැවට සහ නැවේ බඳට සිදුවන භෞතික අලාභ/හානි සම්බන්ධයෙන් නැව් හිමියාට ආරක්ෂාව සලසනු ලබන සියළු අවධානම් රක්ෂණ ආවරණයකි.

ගින්නක් හෝ වෙනත් විශේෂ උවදුරු හේතුවෙන් රක්ෂිත දේපලකට පාඩු හෝ හානි සිදුවන අවස්ථාවකදී ජාතික රක්ෂණ භාර අරමුදලේ ගිනි රක්ෂණ උවදුරු ඔප්පුවෙන් මූල්‍ය වන්දි පිරිනමනු ලැබේ.

කෙසේ වුවද, එවැනි දේපළ අයිතිකරුවෙකු සිදුවීමට කලින් පදිංචි වී සිටිමින් පසුව සමාන මූල්‍ය තත්ත්වයකට පත්වීමට නියමිත නම් දේපළ ප්‍රමාණවත් පරිදි විධිමත් ආකාරයට රක්ෂණය කර තිබිය යුතුය.



ජාතික රක්ෂණ භාර අරමුදලේ ගිනි උවදුරු රක්ෂණ ඔප්පුවෙන් ගෘහස්ත බොයිලේරු, ගෑස් ස්ථාපනයන් පිපිරීම් ඇතුළු ගිනි හා විදුලි උවදුරු වලින් සිදුවන අලාභහානි සම්බන්ධයෙන්, රක්ෂණ ආවරණය සපයනු ලබන අතර, මෙය පිපිරීම්, හිතාමතා හානි සිදු කිරීම්, සංඝට්ටන හානි ගුවන් යානා හානි, පුපුරා යාම්, ජලටැංකි උපකරණ හෝ නල පිටාර ගැලීම් මෙන්ම ජල ගැලීම් භූ කම්පන,ගිනි කඳු පිපිරීම්,සැඩ කුනාටුව, නිවර්තන සුළි සුළඟ (ටයිෆූනය) ගිගිරුම් සහිත කුණාටුව, ප්‍රචණ්ඩ සුළි සුළඟ, සුනාමිය හා උදම් රළ වැනි අතිරේක උවදුරු ආවරණය කරනු පිණිස දීර්ඝ කරනු ලැබිය හැකිය. තවද, එය වැඩ වර්ජන කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද සහ ද්වේශ සහගත අලාභහානි සිදු කිරීම වෙනුවෙන්, ආවරණය සැලසෙන පරිදි දීර්ඝ කළ හැකිය.

මෙම විවිධ පන්ති රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ පුද්ගල හදිසි අනතුරු රක්ෂණය සැත්කම් හා සෞඛ්‍ය රක්ෂණය, මුදල් රක්ෂණය, ගමන් භාණ්ඩ රක්ෂණය, ගෙවල් බිඳුම් රක්ෂණය, සේවක වන්දි රක්ෂණය, වෙළහෙළදාම් ස්ථාන රක්ෂණය මහජන වගකීම් හා සෙසු විවිධ පන්ති රක්ෂණය වෙනුවෙන් මෙය ආවරණය සලසනු ලැබේ.ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ඉංජිනේරු උපකරණ රක්ෂණය, පරිගණක රක්ෂණය, බොයිලේරු හා පීඩන රක්ෂණය, කොන්ත්‍රාත්කරුවන්ගේ සියළුව අවධානම් රක්ෂණය, (**CAR**) ඉවත් කිරීම සියළු අවධානම් රක්ෂණය සහ අනෙකුත් ඉංජිනේරු අවධානම්


වලට අදාල අවධානම් ආවරණය කරනු ලබන ඉංජිනේරු රක්ෂණ ඔප්පුද ඇතුලත් කර ඇත.

මීට අමතරව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කම්කරු වන්දි රක්ෂණයක් සපයනු ලැබේ. 1934 කම්කරුවන්ට වන්දි ගෙවීමේ ආඥාපනතෙහි කොන්දේසි මගින් යම් වෘත්තියක නිරත වීම නිසා හටගන්නා ලද වෘත්තිමයරෝග සහ තුවාලවීම් සඳහා වගකිවයුතු ආකාරයකට වන්දි ගෙවීමක් සිදු කිරීමට එකඟ වී ඇත. මෙම ආඥා පනතේ නවතම සංශෝධනය වන්නේ තාවකාලික, ස්ථිර හෝ තම වැටුප පිළිබඳ නොසලකා හරින සියළුම ආකාරයේ ශ්‍රමිකයන්හට වන්දි ගෙවීම සිදුකළ යුතුය යන්නයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සියළුම සේවානියුක්තියන් වෙනුවෙන් පැවති වගකීමේ සැලකිය යුතු වර්ධනයක් දක්නට ලැබේ. එම නිසා, ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ සේවක වන්දි ගෙවීමේ රක්ෂණ ක්‍රමය සඳහා සේවා නියුක්තියන් වෙනුවට රක්ෂණය වූවන්ගේ වගකීම් සමහරක් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පවරාගෙන ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදලේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ රෝහල් ගතවීම්, හෙද සත්කාර, කාමර වියදම්, ශල්‍ය වෛද්‍ය, නිර්වින්දන හා වෛද්‍ය ගාස්තු, විශේෂඥ සහ උපදේශන ගාස්තු සහ විශේෂඥ සේවා සඳහා ප්‍රතිලාභ සලසයි.


ගිනි උවදුරු රක්ෂණ ක්‍රමය සඳහා 2011 වර්ෂයේදී මාසික හිමිකම් පෑම් වාරික හා ලාභ විශ්ලේෂනය මතු දැක්වෙන පරිදි වේ.

**<u>සටහන 5.13: ගිනි රක්ෂණය</u>**
**<u>ලාභය, වාරිකය සහ හිමිකම් පෑම්</u>**





මුහුදු උවදුරු රක්ෂණ ක්‍රමය සඳහා 2011 වර්ෂයේදී මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.

**සටහන 5.14: මුහුදු උවදුරු රක්ෂණ ඔප්පුව ලාභය, වාරිකය සහ හිමිකම් පෑම්**





වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා 2011 වර්ෂයේදී මාසික හිමිකම්පෑම්, වාරික හා ලාභ විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.

**සටහන 5.15: වෛද්‍ය රක්ෂණය ලාභය, වාරිකය සහ හිමිකම් පෑම්**




විවිධ රක්ෂණ ක්‍රමය සඳහා 2011 වර්ෂයේදී මාසික හිමිකම්පෑම්, වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දැක්වෙන පරිදි වේ.

**සටහන - 5.16: විවිධ රක්ෂණය ලාභය, වාරිකය සහ හිමිකම් පෑම්**



# විදේශ රැකියා රක්ෂණය පිළිබඳ සමාලෝචනය



ජාතික රක්ෂණ භාර අරමුදල සහ ශ්‍රී ලංකා විදේශ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් නිකුත් කරන ලද රැකියා කාර්යාංශය අතර අවබෝධතා ගිවිසුමක් " විදේශ රැකියා" රක්ෂණ ඔප්පුව, මගින්, ජාතික අත්සන් කිරීමෙන් පසු සංක්‍රමණ සේවකයන් ආරක්ෂා රක්ෂණ භාර අරමුදල වෙතින් රක්ෂණ ආවරණය කිරීම උදෙසා “විදේශ රැකියා” විදේශීය රැකියා ලැබ විදෙස් රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර යන රක්ෂණ යෝජනා ක්‍රමය සැලසුම්කර ඇත.

18 – 65 අතර වයස කණ්ඩායමෙහි ශ්‍රී ලාංකිකයන්ට මෙමගින් රක්ෂණ ආවරණය සැලසේ.



එමගින් පහත සඳහන් ප්‍රතිලාභ සැලසේ.

| **සිදුවීම** | **ප්‍රතිලාභ** |
|---|---|
| විදේශ රැකියාවක් සඳහා පිටත්වීමෙන් පසු අඩන්තේට්ටම් කිරීම, අසනීප වීම, හදිසි අනතුරකට පත්වීම, තුවාල වීම නිසා සිය රටට පැමිනීම (විදේශගතව සිටින අතරතුරදී කොන්ත්‍රාත් කාල පරිච්ඡේදය කොන්ත්‍රාත් කාලය අවසන්වී මාස 03 කට පසුවද මෙම ප්‍රතිලාභවලට සංක්‍රමණ සේවකයා හිමිකම් ලබයි) | ගුවන් ටිකට්පතේ තථ්‍ය වටිනාකම සහ රු. 25,000/- (ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසුව දරනු ලබන වෛද්‍ය ගාස්තු) |
| ගිවිසුම් කාල පරිච්ඡේදය තුල වැඩ කරමින් සිටින අතරතුරේ, අනුග්‍රාහකයා හෝ ඔහුගේ පවුලේ සාමාජිකයන් විසින් සිදු කරනු ලබන ලිංගික අඩන්තේට්ටමක ප්‍රතිඵලයක් වශයෙන් ඇතිවන ගර්භනීභාවයක් නිසා සිය රටට ආපසු පැමිණීම. (අනුග්‍රාහකයන්ගෙන් පලායාම හිමිකම් නොලබයි) | ගුවන් ටිකට්පතේ තථ්‍ය වටිනාකම සහ රු. 25,000/- (ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසුව දරනු ලබන වෛද්‍ය ගාස්තු) |
| විදේශගතව සේවය කරමින් සිටින අතරතුරේ යම් හේතුවක් නිසා මරණයට පත්වීම. | රු. 400,000.00 |
| ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ සේවය කරමින් සිටින අතරතුරේ සිදුවන්නා වූ හදිසි අනතුරකින් වන අසාධ්‍ය රෝගයක් නිසා ආපසු පැමිණීමෙන් වාස 03 ක් ඇතුළත ශ්‍රී ලංකාව තුළ මරණයට පත්වීම. | රු. 200,000.00 සහ ගුවන් ටිකට්පතේ තථ්‍ය වටිනාකම |
| ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ විදේශගතව සේවය කරමින් සිටින අතරතුරේ සිදුවන්නා වූ පූර්ණ අබලතාවයට (මාස 03 කට පසුව වුවද සංක්‍රමණ සේවකයකු මෙම ප්‍රතිලාභයට හිමිකම් ලබනු ඇත.) | උපරිම රු. 200,000,00 සහ ගුවන් ටිකට්පතේ තථ්‍ය වටිනාකම සහ (උපරිම) රු.50,000.00 (ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු දරනු ලබන වෛද්‍ය වියදම්) |
| ගිවිසුම් කාල පරිච්ඡේදය තුළ විදේශගතව සේවය කරමින් සිටින අතරතුරේ සිදුවන්නා වූ ආංශික අබලතාවය (මාස 03 කට පසුව වුවද සංක්‍රමනික සේවකයකු මෙම ප්‍රතිලාභයට හිමිකම් ලබනු ඇත.) | උපරිම රු. 100,000,00 සහ ගුවන් ටිකට්පතේ තථ්‍ය වටිනාකම සහ (උපරිම) රු.50,000.00 (ශ්‍රී ලංකාවට ආපසු පැමිණීමෙන් පසු දරනු ලබන වෛද්‍ය වියදම්) |

| පවුලේ සාමාජිකයා | ප්‍රතිලාභ |
|---|---|
| පවුලේ සාමාජිකයා සඳහා වන ආවරණය - වෛද්‍ය වියදම් මරණයට පත්වීමකදී වන වියදම් - විවාහක නම් - කලත්‍රයා සහ අවිවාහක - සහ රැකියාවක් නොකරන වයස 18 අඩු ළමයින්- අවිවාහක නම් - දෙමාපියන් | දිනකට රු. 150 බැගින් නොගෙවන වාට්ටුවක ප්‍රතිකාර සඳහා පවුල් ඒකකයකට රු. 25,000.00 (වසරකට දෙවරක් පමණි) |


ජාතික රක්ෂණ භාර අරමුදලෙන් රක්ෂණ ආවරණයක් ලබා ගැනීමෙන් පසු විදේශ රැකියාවක් සඳහා විදේශගතවන වයස අවුරුදු 18 සිට 65 දක්වා වයසේ සිටින ශ්‍රී ලාංකිකයන් මෙම රක්ෂණ ඔප්පුව මගින් ආවරණය කෙරේ. වර්ෂ දෙකක කොන්ත්‍රාත් කාලය සඳහා වාරිකය රු. 800 +***vat*** බද්ද සහ වසර 3 ක කාලය සඳහා රු. 850+ ***vat***. අය කෙරේ.


විදේශ රැකියා රක්ෂණ ක්‍රමය වෙනුවෙන් 2010 වර්ෂය සඳහා මාසික හිමිකම් පෑම් වාරික සහ ලාභ විශ්ලේෂණය මතු දක්වෙන පරිදි වේ.

**සටහන 5.17: විදේශ රැකියා රක්ෂණාවරණය**

**විදේශ රැකියා රක්ෂණය හිමිකම්පෑම්**

**වාරික සහ ලාභ විශ්ලේෂණය**






# 6. තිරසාර වාර්තාකරණය

තිරසාර සංවර්ධන අරමුණ කරා ළඟා වීමේ සංවිධානමය කාර්යසාධනය උදෙසා, මැන බැලීම, අනාවරණය කිරීම සහ අභ්‍යන්තර හා බාහිර පාර්ශවකරුවන්ට වගකීම තිරසාර වාර්තාකරණයවේ. ආයතනයක සාමාජීය, පාරිසරික, සංස්කෘතික සහ ආර්ථික කාර්ය සාධනය හා බලපෑම මෙන්ම වාර්තා කරන සංවිධානයක් ස්වකීය කාර්යසාධනය වැඩි දියුණු කිරීමට ගනු ලබන මූලික පියවර පිළිබඳ තොරතුරු සැපයීම තිරසාර වාර්තාකරණය මගින් අපේක්ෂා කෙරේ.

ස්වකීය ජාතික හා සාමූහික තිරසාරභාවය කෙරෙහි ඇති තර්ජන පිළිබඳ ඉහළ අවබෝධයේ ප්‍රතිඵලයක් වශයෙන් තිරසාරභාවය රජයන්තුළ විශාල වශයෙන් පැලපදියම් වී ඇත. රජයේ නියාමන අභිලාෂය නිසා පමණක් නොව ඔවුන්ගේම තිරසාරභාවයට ඇති තර්ජන නව්‍යකරණයට ඇති අවස්ථා සහ පිරිවැය අඩු කිරීම් නිසා සමාගම්වල තිරසරභාවය කෙරෙහි ඇති සැලකිල්ල වැඩිවෙමින් පවතී.

2011 වසර දෙසට රක්ෂණ කර්මාන්තය යොමුවන බැවින්, ව්‍යාපාර වල ආයතනික තිරසාරභාවය ප්‍රමුඛ අවධානයට ලක්වී ඇත. ඒ අනුව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ආර්ථික සමෘද්ධිය, පාරිසරික ගුණාත්මකභාවය හා සමාජ ගුණාත්මකභාවයේ සැබෑ තත්ත්වය පිළිබඳ නව කාර්ය සාධන මානයන් සාක්ෂාත් කර ගැනීම මගින් ස්වකීය ව්‍යාපාර කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා යත්න දරන අතර, සංවිධානමය ආර්ථිකමය හා පාරිසරික මෙන්ම සමාජ කාර්ය සාධනය හැකි හැම අවස්ථාවකම වැළඳ ගැනීම හරහා “වඩා යහපත් ආයතනික පුරවැසියකු” වීමට ප්‍රයන්තය දරයි.

තිරසාරභාවය ආයතනික සංස්කෘතිය තුළ ගැඹුරින් රෝපණය වී ඇති අතර, ජාතික රක්ෂණ භාර අරමුදලේ පිළිගත් ජීවිත ක්‍රමයක් වෙයි. අපගේ ව්‍යාපාරික අරමුණුවලට එහා යන සමාජයකට බලපෑමක් නිර්මාණය කිරීමට අප උත්සාහ දරණ අතර, අපගේ ජාතිය නගා සිටුවන්නා වූ භර පද්ධතිය පුබුදුවාලීමට දායක වන්නෙමු.අප වේගවත්ව ගොඩ නගනු ලබන සම්බන්ධතා සහ අප ව්‍යාපාර කරන ආකාරය තිරසාරභාවය සංකල්පය වටා කේන්ද්‍රියවන අපගේ සියලුම පාර්ශවකරුවන්, නගාසිටුවීමටත්, ඔවුන්ට උපකාර කිරීමටත් ඔවුන් ශක්තිමත් කිරීම සඳහාත් අපගේ ජාතියට අර්ථාන්විතව දායකවීමේ අවංක සහ හෘදයාංගම අරමුණ ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතුවලින් පිළිඹිබු කරයි.

ආර්ථික වර්ධනය ඉහළ යන අතරතුර ශක්ති පරිභෝජනය, නාස්තිය, පාරිභෝගිකයන් හට ලබාදෙන පොලිතින් ප්‍රමාණය අවම කිරීම වැනි පියවර ගැනීම මගින් පරිසරය විනාශවීම හෝ සමාජ තත්ත්වය කඩා වැටීම වැලැක්වීමේ අරමුණින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් තිරසාර වෙළඳ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කර ඇත. එසේ වගකිවයුතු සේවා යෝජකයෙකු ලෙස සිය කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ වෘත්තිය අභිවෘද්ධිය උදෙසා ඔවුන් විවිධ පුහුණු සඳහා යොමු කිරීම, සිය සැපයුම්කරුවන්හට සාධාරණ මිලක් ගෙවීම, වගකීමෙන් සහ තිරසරභාවයකින් යුතුව ලිපිලේඛන සහ උපකරණ වැනි යෙදවුම් භාවිතය වායුසමීකරණ හා විදුලි පරිභෝජනය කරනු ලබන වෙනත් උපකරණ භාවිතය පාලනය කිරීම ආදී ක්‍රමවේදයන් හරහා පරිසරයට කාබන් මුදා හැරීම අවම කිරීම සඳහා වූ පියවරයන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගනු ලබයි.


<u>**පරදු දරන්නන් 1 කණ්ඩායම - රජය**</u>

අතීත සම්ප්‍රදාය අනුව යමින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2011 වසරේදී ඒකාබද්ධ අරමුදලට රුපියල් මිලියන 3495 ක් ලබා දීම මගින් එකී දායකත්වය සැළකිය යුතු ප්‍රමාණයකින් වැඩිකර ඇත. 2008, 2009 සහ2010 වර්ෂවල මෙම අරමුදලට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සපයන ලද මූල්‍ය දායකත්වය පිළිවෙලින් රු.මිලියන 1000 - මිලියන 2250 සහ රු. මිලියන 2000 ක් වේ.

වගුව - 6.01: ඒකාබද්ධ අරමුදලට දායකත්වය

| මුදල් වර්ෂය | රු. මිලියන |
|---|---|
| 2006 | 4,000 |
| 2007 | - |
| 2008 | 1,000 |
| 2009 | 2,250 |
| 2010 | 2,000 |
| 2011 | 3,495 |

සටහන- 6.01: රටේ සංවර්ධනයට ජාතික රක්ෂණ භාර අරමුදලේ දායකත්වය




**පරදු දරන්නන් 2 වෙනි කණ්ඩායම - පාරිභෝගිකයන්**

වස්තුහංගය හෝ ණය අවදානම අවම කිරීම මගින් සහ ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරූපය ඉහළ නංවමින් පාරිභොගිකයින්ට වඩා හොඳ සේවයක් ලබාදීම පිණිස ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකා රක්ෂණ ආයතනයත්, ඉතිහාසය තුළ ලත් ඉහළම මූල්‍ය RAM ශ්‍රේණිගත කිරීම වන AAA තත්ත්වය අඛණ්ඩව පවත්වාගෙන ඇත.




මැදපෙරදිග රටවල සේවයෙහි යෙදී සිටින ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් වෙනුවෙන් විදේශ රක්ෂණ ක්‍රමය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල මගින් රක්ෂණ ආවරණ පිරිනමා ඇත. පීඩාවට පත් සමහර පිරිස වෙනුවෙන් රක්ෂණ භාර අරමුදල මගින් කරුණා සහගත දීමනා ගෙවා තිබේ.

තවද ජාතික රක්ෂණ භාර අරමුදලේ පස්වන සංවත්සර සැමරුම් කාලය තුළ හිමිකම් ගෙවීමේ ක්‍රියාවලිය වඩා වේගවත් හා වැඩි දියුණු කිරීම සඳහා අග්‍රහාර විද්‍යුත් කාඩ්පතක් හඳුන්වා දී ඇත.



2011 වර්ෂයේදී ජාතික රක්ෂණ භාර අරමුදල ස්වකීය පස්වන සංවත්සරය අභිමානයෙන් සමරණ ලදි.තවද, ජාතික රක්ෂණ භාර අරමුදලේ පස්වන සංවත්සර සැමරීමේදී කඩිනමින් හිමිකම් පෑම් ගෙවීමේ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීම පිණිස අග්‍රහාර විද්‍යුත් කාඩ්පතක් හඳුන්වා දී ඇත.

එක් එක් රාජ්‍ය සේවකයෙකුටම ඊ කාඩ්පතක් නිකුත් කිරීම සඳහා ව්‍යාපෘතියක් සකස් කරනු ලැබූ අතර ඒ අනුව අග්‍රහාර සාමාජිකත්වය සඳහා දත්ත පද්ධතියක් නිර්මාණය කළ හැකිය. එමඟින් රෝහල් වලින් පහසුවෙන් වෛද්‍ය සේවා ලබා ගැනීමට, සාමාජිකයන්ට හැකිවනු ඇත



**<u>පරදූ දරන්නන් 3 කණ්ඩායම - සමාජය</u>**

බුත්තල පවත්වන ලද 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය කාලය තුලදී නොමිලේ ඇස් කණ්ණාඩි සැපයීම සහ ඇස් කණ්ණාඩි පරිත්‍යාග කිරීමේ ව්‍යාපාරයක් ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කරන ලදි. එමෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2011 දැයට කිරුළ ප්‍රදර්ශනය වෙනුවෙන් පෞද්ගලික හදිසි අනතුරු ආවරණයක ආරක්ෂාවද ලබාදී තිබේ.

තවද ජාතික රක්ෂණ භාර අරමුදල විසින් දඹගල්ල රෝහල නවීකරණය කරනු ලැබූ අතර, වෛද්‍ය උපකරණ, ඇඳන් හා රෝද පුටු පරිත්‍යාග කරන ලදි.



ජාතියට කරන ලද ස්වකීය සේවය වෙනුවෙන් අපේ රටේ ජන නායක වන අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහ මව්බිම ආරක්ෂා කිරීමට වටිනා ජීවිතය කැපකළ ශ්‍රී ලංකාවේ යුධ හමුදාවේ රණවිරුවන්ට සෙත්පතා, මෙම ආයතනය ආරම්භ කිරීමෙන් පසු දෙවෙනි වතාවටත් අපගේ නව ප්‍රධාන කාර්යාලයේදී ලේ දන්දීමේ ව්‍යාපාරයක් සහ පිරිත් පිංකමක් පවත්වන ලදි.





**<u>පරදූ දරන්නන් 4 කණ්ඩායම - සේවකයන්</u>**

රක්ෂණ පාරිභෝගිකයන් රඳවා තබා ගැනීමේ සම්බන්ධතාවය ගොඩ නැගීම සඳහා ප්‍රයන්ත දරන්නාවූ ජාතික රක්ෂණ භාර අරමුදල සේවාව පාදක කරගත් ආයතනයක් බැවින් අතිශය තරඟකාරී රක්ෂණ වෙළඳපොල තුල සිය සාර්ථකත්වය රඳාපවතින වැදගත්ම සාධකය ලෙස මානව සම්පත් ශක්‍යතාවය හඳුනාගනී. එම නිසා, කාර්ය මණ්ඩල පුහුණු වැඩ සටහන් හා

සංවර්ධන වැඩ සටහන්, සුභ සාධන වැඩසටහන් සංවිධානය කරන අතර, ස්වකීය වෘත්තිය ධාරිතාවයන් වර්ධනය කර ගැනීම පිණිස, ආයෝජනය කරයි.



වගුව - 6-02: කාර්ය මණ්ඩල සුභසාධනය

**කාර්ය මණ්ඩල සුභසාධන වියදම (රු)**

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 |
|---|---|---|---|---|---|
| 1සුභසාධන වියදම | 195,420 | 606,228 | 233,313 | 935,912 | 1,438,399 |
| 2වෛද්‍ය රක්ෂණය | 94,600 | | | 120,825 | 176,017 |

කණ්ඩායම් හැඟීම සහ කාර්යය මණ්ඩලයේ එකමුතුභාවය හා සංහිදියාව වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරිව රාජකීය විද්‍යාල ක්‍රීඩා පිටියේදී 2011 අප්‍රේල් මාසයේදී ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික බක්මහ උළෙල පවත්වන ලදි.



2006 අංක 28 දරන රක්ෂණ භාර අරමුදල් පනත යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල ස්ථාපිත කරන ලදි. එදා සිට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකා සමාජයේ විවිධ අංශ ආරක්ෂා කිරීම උදෙසා පහත සදහන් සුභසාධනයන් පදනම් කරගත් රක්ෂණ යෝජනා ක්‍රම සකස් කරනු ලැබූ අතර 2011 වර්ෂය තුළදීද එකී රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාවට නංවන ලදි.

### *i.* අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය

රජයේ නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් 1997 වර්ෂයේදී පිහිටුවනු ලැබූ වෛද්‍ය රක්ෂණ ක්‍රමය හඳුන්වනු ලැබුවේ අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය ලෙසිනි. එම රක්ෂණ ක්‍රමය ආරම්භයේදී ක්‍රියාත්මක වූයේ එහි සාමාජිකයෙකුගේ මාසික වැටුපෙන් රු. 11.00 ක රක්ෂණ වාරික මුදලක් අඩුකරනු ලැබීමෙනි. එසේ වුවද 2005 රජය විසින් පසුව ගත් තීරණයක් අනුව මෙකී රක්ෂණ ක්‍රමය වෙනුවෙන් සියලුම රජයේ නිලධාරීන්ගේ මාසික වැටුපෙන් මසකට රු. 75.00 ක රක්ෂණ වාරික මුදලක් අඩු කරනු ලැබුනි. ශ්‍රී ලංකා රක්ෂණ සමාගම පෞද්ගලීකරණයට ලක්කරන තුරුම මෙම රක්ෂණ ක්‍රමය ශ්‍රී ලංකා රක්ෂණ සමාගම විසින් ක්‍රියාත්මක කෙරිණි. එහි පෞද්ගලීකරණයත් සමඟ 2006 ජනවාරි මස 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි රජය විසින් මෙකී රක්ෂණ ක්‍රමය පවරාගනු ලදුව එය වෙනම රජයේ රක්ෂණ ක්‍රමයක් ලෙස ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ ක්‍රියාත්මක කරන ලදි.

### ii. වැඩ වර්ජන කැරලි, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදල කළමනාකරණය ( SRCC &Tr *)*

වැඩ වර්ජන කැරලි, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදල, අමාත්‍ය මණ්ඩලය විසින් එළඹි තීරණය ප්‍රකාරව 1987 දී ස්ථාපනය කරන ලදී. අමාත්‍ය මණ්ඩලය එකී තීරණයට එළඹියේ ශ්‍රී ලංකාව තුළ බලපත්‍රලාභී රක්ෂණ සංවිධාන වන්නා වූ මෙකී අරමුදලෙහි සියලුම සාමාජිකයින් විසින් නිකුත් කරනු ලැබූ, ශ්‍රී ලංකාවේ භූගෝලීය සීමාවන් ඇතුලත වැඩ වර්ජන, කලකෝළාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් හේතුවෙන් සිදුවන දේපළ නැතිවීම්/හානි සහ/හෝ පුද්ගල සෞඛ්‍ය ගැටළු, හදිසි අනතුරු, ශාරීරික තුවාල ආවරණය කිරීමට විස්තෘත වූ රක්ෂණ ඔප්පු පිළිබඳ අතිරේක රක්ෂණාවරනයක් සැපයීමේ අරමුණෙනි. 1987 සිට මෙම අරමුදල ජාතික රක්ෂණ සංස්ථාව විසින් පාලනය කරනු ලබයි.

ජාතික රක්ෂණ සංස්ථාවේ අනුප්‍රාප්තිකයන් වන්නාවූ සීමාසහිත ජනශක්ති රක්ෂණ සමාගම වෙතින් පවරා ගන්නා ලදුව 2005.08.01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම අරමුදල මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශය විසින් පරිපාලනය කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදල් පනතෙහි 18(ඇ) වගන්තිය ප්‍රකාර, වැඩ වර්ජන, කලකෝළාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල, ජාතික රක්ෂණ භාර අරමුදල යටතට ගැණිනි. රක්ෂණ සමාගම වෙතට වැඩ වර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදලෙහි හිමිකම් ප්‍රතිපූර්ණය කිරීමත් සැලකේ.

### *iii.* පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රක්ෂණ ක්‍රමය

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී ඇත. මෙම ක්‍රමය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනෙකුට ප්‍රතිලාභ අත්වේ. මෙම රක්ෂණ ක්‍රමය මගින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පහත සඳහන් ප්‍රතිලාභ පිරිනමයි.

***01.*** හදිසි අනතුරු රක්ෂණ ආවරණය

| | |
|---|---|
| හදිසි අනතුරකින් ජීවිතක්ෂයට පත්වීම | **Rs. 5,000,000.00** |
| හදිසි අනතුරක් හේතුවෙන් සම්පූර්ණයෙන් විකලාංග භාවයට පත් වීම | **Rs. 5,000,000.00** |
| ***02.*** වසරක වෛද්‍ය රක්ෂණ ආවරණය | **Rs. 200,000.00** |

*iv.* **ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තයට ප්‍රතිරක්ෂණ ආවරණය**

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ අවධානම භාර ගැනීමද ආරම්භ කරන ලදි. ජාතික රක්ෂණ භාර අරමුදලේ විධි විධාන ප්‍රකාර, ශ්‍රී ලංකාවේ සියලුම රක්ෂණ සමාගම් විසින් සිය මුළු ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයන්ගෙන් 20% ක් දක්වා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ලබා ගැනීම අනිවාර්ය අවශ්‍යතාවයකි. 2011 වර්ෂයේ ඔක්තෝබර් මාසය අවසානයේ සිට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ශ්‍රී ලංකාවේ රක්ෂණ සමාගම් වල ප්‍රතිරක්ෂණ සහතික වලින් 20% ක් ආපසු පවරා දීමේ වැඩසටහන යටතේ ප්‍රතිරක්ෂණය කර ඇත.

*v.* **මෝටර් රථ වාහන රක්ෂණ ක්‍රමය (රජයට අයත් මෝටර් රථවාහන සඳහා)**


නැතිවීමේ හෝ හානිවීමේ අවධානමක් සහිත රාජ්‍ය ආයතන(වෛකල්පිත) සහ අර්ධ රාජ්‍ය ආයතන (වෛකල්පිත) සතුව පවතින මෝටර් රථවාහන, රක්ෂණය කිරීම රජය විසින් උසුලනු ලැබීය. ජාතික රක්ෂණ භාර අරමුදලින් මෝටර් රථ වාහන රක්ෂණය රාජ්‍ය අංශයට ලබාදුන් අතර ඉන් පසු එය පෞද්ගලික අංශයටද ප්‍රසාරණය කෙරිණි. එහි පුළුල් රථවාහන රක්ෂණය මගින් ගින්නෙන් සහ සොරකම් කිරීමෙන්, තෙවැනි පාර්ශවයට සිදුවන හානි, (මරණයට පත්වීම හෝ තුවාල සිදුවීම) සහ අමතර ආවරණයන් (ගංවතුර, වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදය වැනි) ආවරණය කරනු ලබයි.

*vi.* **විදෙස් රැකියා විදෙස්ගත සේවා නියුක්ති රක්ෂණ ක්‍රමය**

2008 ජූනි මස අවසානයේ සිට ශ්‍රී ලංකාවෙන් බැහැර විදෙස් ගතවූ කම්කරුවන් සඳහා වන මෙකී විදේශ රැකියා රක්ෂණ ඔප්පුව මගින් ජාතික රක්ෂණ භාර අරමුදලෙහි රක්ෂණාවරණය ලබාගැනීමෙන් අනතුරුව විදේශ රැකියා සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැර වන්නා වූ අවුරුදු 18 සිට 65 දක්වා වයස් කාණ්ඩයන්හි ශ්‍රී ලාංකිකයන් ආවරණය කෙරෙ.

*vii.* **සාමාන්‍ය රක්ෂණ ක්‍රමය**

2009.08.20 දින නිකුත් කළ අංක 1615/20 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව රක්ෂණ ක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල විසින් මෙකී සාමාන්‍ය රක්ෂණ ක්‍රමය යටතේ ගිනි රක්ෂණ සහතික, මුහුදු රක්ෂණ සහතික, සේවක වන්දි රක්ෂණ සහතික පිරිනමනු ලබයි.




# 07. පාලන වාර්තාකරණය - සංයුක්ත පාලනය

## හැඳින්වීම

ව්‍යවසාය පරිපාලනය යනු ක්‍රමෝපායික මඟපෙන්වීම සපයන්නාවූ ඉලක්කය පෙරදැරිකරගෙන, අරමුණ සාක්සාත් කරගනු ලබන බවට සහතික කරමින්, අවදානම් සුදුසු පරිදි කළමනාකරණය කරනු ලබන බවට නිශ්චිතව අවබෝධකර ගනිමින්, ආයතනය අයත් සම්පත් වගකීමෙන් යුතුව භාවිතා කරනු ලබන බවට සත්‍යාපනය කරමින් මණ්ඩලය සහ විධායක කළමනාකරණය විසින් ක්‍රියාත්මක කරනු ලබන වගකීම් සහ ක්‍රියාමාර්ග සමුදායකි.

ව්‍යවසාය පරිපාලනය ආයතනික පරිපාලනයේ මානයන් දෙකක් වන අනුකූලතාවය සහ කාර්ය සාධනයෙන් සමන්විත වේ.

පාලන මණ්ඩල ව්‍යුහයන්, කාර්යභාරයන් හා විධායක වැටුප් හා සම්බන්ධ කරුණු අනුකූලතාවය යටතට ගැනෙන අතර සහතික කිරීම සහ විගණනයට යටත්ව හා අනුකූලව සංකේත සහ/හෝ ප්‍රමිතීන්ට මෙම අංශයට සහයෝගය දැක්විය හැකිය.

කාර්යසාධන අධීක්ෂණය ක්‍රමෝපායන් හා අගය නිර්මානය කිරීම මත කේන්ද්‍රගත වේ. මණ්ඩලය විසින් ස්වකීය අවදානම් වලට මුහුණ දීම සහ කාර්යසාධනය ඉහළ දමන්නා වූ සාධක අවබෝධ කර ගනිමින් ක්‍රමෝපායික තීරණ ගැනීම අවශ්‍ය වේ. මෙය පවතින ප්‍රමිතීන් සහ විගණනය සමඟ පහසුවෙන් අනුරූප නොවන්නේය. එම නිසා, විවිධාකාරවූ ආයතන වලට පැහැදිලිව අදාළකරගත හැකි ප්‍රශස්ත භාවිත මෙවලම් සහ ශිල්පීය ක්‍රම සමුදායක් සංවර්ධනය කිරීම යෝග්‍ය වේ.

මනාව අර්ථ දක්වා ඇති සහ බලාත්මක කර ඇති ආයතනික පාලනයක් මගින් ආයතනය විසින් පිළිගත් ආචාර ධර්ම ප්‍රමිතීන් සහ ප්‍රශස්ත භාවිතයන් මෙන්ම විධිමත් නීතීන් වලට අනුකූලව කටයුතු කරන බව සහතික කරමින් අදාළ සැම කෙනෙකුගේම, යහපත උදෙසා යටත් පිරිසෙයින් න්‍යායෙන් කටයුතු කරනු ලබන්නාවූ ව්‍යුහයක් සපයනු ලබයි.

ආයතනික බලය අනිසි ලෙස යොදා ගැනීම හා සම්බන්ධ අවධානයට ලක්වන්නාවූ, අපකීර්තියට පාත්‍රවන ක්‍රියා, ආයතනික නිලධාරීන් විසින් කරනු ලබතැයි කියන සාපරාධී ක්‍රියා වැනි සමහර සිද්ධීන් හේතුවෙන් පසුගිය වර්ෂවලදී ආයතන පාලන කෙරෙහි ඇති අවදානය ඉහළ ගොස් ඇත. ඵලදායි ආයතන පාලන තන්ත්‍රයකට ආයතනයේ නමින් ආචාර සම්පන්න නොවන හෝ නීති විරෝධී ක්‍රියා සිදුකරන පුද්ගලයන්ගේ සිවිල් හෝ සාපරාධී නඩු පැවරීම උදෙසා වන විධි විධාන ඇතුළත් වන්නේය.

ජාතික රක්ෂණ භාර අරමුදලට ආයතන පාලනයේ උසස් ප්‍රමිතීන් ප්‍රදර්ශනය කිරීමේ සාඩම්බර ඉතිහාසයක් තිබේ. කර්මාන්තය තුළ ස්වයං නියාමනය සහ ප්‍රශස්ත භාවිතයන්ට පුරෝගාමී වීම සමාගමේ ව්‍යාපාරය කිරීමේ මාර්ගය වේ.රජයට අනුබද්ධ ජාතියේ එකම ප්‍රතිරක්ෂිතයා වීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදලේ ආයතන පාලන පදනම තවදුරටත් ශක්තිමත් කරණු ලැබ ඇත.

මනාව පාලනය වන පරිසරයක තරඟකාරී හැසුරුම ලෙසින් ප්‍රබල ශක්තිමත් ආයතන පාලනයේ වැදගත් බව ජාතික රක්ෂණ භාර අරමුදල විසින් හඳුනාගෙන ඇති අතර එමගින් අවසානයේදී මෙහෙයුම් සඵලතාව, කාර්යක්ෂමතාව, සකසුරුවම්බව නංවාලමින් විනය, විනිවිදභාවය, ස්වාධීනත්වය, වගවීම, වගකීම, සාධාරණත්වය හා සමාජ වගකීම යන උත්කෘෂ්ට සමායතනික පාලන අගයන් ක්‍රියාත්මක කරන අතරම සන්නන් ප්‍රතිරූපය ඉහළ නංවමින් මහජන විශ්වාසය පවත්වා ගනු ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය සහ යහපාලනය සහ සමායතනික පාලන භාවිතයන් සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශ මගින් නිකුත් කෙරෙන ප්‍රශස්ත භාවිතයන් පිළිබඳ සමායතනික පාලන සංග්‍රහයේ නියමයන්ට අනුකූලව ජාතික රක්ෂණ භාර අරමුදල විසින්

ස්වකීය සමායතනික පාලන භාවිතයන් ක්‍රියාත්මක කරනු ලබයි

## මූල්‍ය සහ රක්ෂණ නිපුනතාව

2011 වර්ෂය තුළදී කළමනාකරණ මණ්ඩලයේ මූල්‍ය හා රක්ෂණ නිපුණතාව, සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මනාව සවිමත් කෙරිනි.

## අධ්‍යක්ෂ මණ්ඩලය

ජාතික රක්ෂණ භාර අරමුදල කළමනාකරණය කරනුයේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයින් 8 දෙනෙකුගෙන් යුත් මණ්ඩලයක් මගිනි. එකී කළමනාකරණ මණ්ඩලයට මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරීවරයා, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ නියෝජිතයෙක්, ශ්‍රී ලංකා රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයෙහි අධ්‍යක්ෂ ජෙනරාල් වරයා සහ මූල්‍ය, බැංකු, රක්ෂණ කළමනාකරණය හා නීතිය යන ක්ෂේත්‍රයන්හි විද්වතුන් නියෝජනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන වෙනත් තැනැත්තන් තිදෙනෙක් අයත් වෙති. එක් නියෝජිතයෙකු සභාපතිවරයා වශයෙන් පත් කිරීමට අමාත්‍යවරයාට බලය ඇත්තේය. මතු දැක්වෙන පරිදි පත් කරනු ලැබූ දින සිට මණ්ඩලයෙහි සියලුම සාමාජිකයෝ අවුරුදු 05 ක කාලයක් සඳහා ධූර දැරිය යුත්තාහ. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ගේ නම්, ජාතික රක්ෂණ භාර අරමුදලෙහි අධ්‍යක්ෂ මණ්ඩලය යනුවෙන් සඳහන් කොට ඇති පිටුවෙහි දැක්වේ.

## තොරතුරු සැපයීම

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙර, කාලෝචිත, නිවැරදි, අදාළ සහ විස්තරාත්මක තොරතුරු අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සපයනු ලබන බවට ජ්‍යෙෂ්ඨ කළමනාකරණය විසින් තහවුරු කළ යුතුය.

කාලපරිච්ඡේදයට අදාළ සියලුම මූල්‍ය සහ මූල්‍ය නොවන තොරතුරු මෙම විශ්ලේෂණයන්ට ඇතුළත් කරනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ගැනීම පිණිස මසකට වරක් සභාපතිවරයා සහ අධ්‍යක්ෂ මණ්ඩලය රැස් වේ. 2010 වසර තුලදී අධ්‍යක්ෂ මණ්ඩලය 17 වතාවක් රැස්ව ඇති අතර විගණන කමිටු රැස්වීම් 6 ක් පවත්වා ඇත.

## ව්‍යාපාරික හැසිරීම් සහ ආචාර ධර්ම

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ස්වකීය සේවකයන් ගේ චර්යාව වෙනුවෙන් මනාව පිළිගත් ව්‍යාපාර හැසිරීම් සහ ව්‍යාපාර ආචාර ධර්ම යෝග්‍ය සේ සකස් කර ක්‍රියාත්මක කරනු ලැබ ඇති අතර එම චර්යාවන් සහ ආචාර ධර්මවලට මහජනතාව තුළ හැසිරීම, සදාචාරමය ව්‍යාහාරික ප්‍රමිතීන් සහ වංචාසහගත නොවන චර්යාව ජාතික රක්ෂණ භාර අරමුදලේ වත්කම් ආරක්ෂා කිරීම සහ විධිමත් භාවිතය, අභිලාෂයන් පිළිබඳ ගැටුම් මහහරවා ගැනීම, රක්ෂණ පාරිභෝගිකයින් හා ජාතික රක්ෂණ භාර අරමුදලේ සේවාදායකයින් සමඟ කටයුතු කිරීමේදී සාධාරණව කටයුතු කිරීම, ජාතික රක්ෂණ භාර අරමුදලේ පරිගණක පද්ධති විධිමත් පරිදි භාවිතා කිරීම, පාරිභෝගික තෘප්තිය, නීති සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කිරීම ඇතුළත් වේ.

## අභ්‍යන්තර පාලනය

විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන සැලසුම් හා විෂය පථය පිළිබඳ සමාලෝචනය කිරීම හා එකඟ වීම, අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කිරීම සහ අවශ්‍ය විටදී අදාල ගැටළු හා කළමනාකරණය පිළිබඳ සාකච්ඡා කිරීම, ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය පිළිබඳ සමාලෝචනය කිරීම සහ එම අවදානම් අවම කිරීමට ගනු ලබන ඉදිරි පියවර පිළිබඳ සාකච්ඡා කිරීම හා එකඟ වීම, සෑම අවස්ථාවකදීම අභ්‍යන්තර/බාහිර විගණකවරුන් සමග සඵලදායී සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම, අවශ්‍ය අවස්ථාවලදී ජාතික රක්ෂණ භාර අරමුදලට අදාළ කරුණු හා සාකච්ඡා කිරීම පිණිස අභ්‍යන්තර සහ බාහිර විගණකවරුන් වෙන වෙනම හමුවීම වැනි විවිධ යාන්ත්‍රණ හරහා මූල්‍ය හා මූල්‍ය නොවන පාලන පද්ධති පරිපූර්ණව අධීක්ෂණය කරනු ලබයි.

2011 වර්ෂය තුලදී බාහිර විගණන කටයුතු සිදු කරනු ලැබුවේ විගණකාධිපති දෙපාර්තමේන්තුව විසිනි. එම වර්ෂය තුලදී දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණනය සහ වැඩ වර්ජන ඇතුළුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලැබ ඇත්තේ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසිනි.


**ව්‍යවසාය පරිපාලනය**

| සංයුක්ත පාලන මූලිකාංග | ජාතික රක්ෂණ භාර අරමුදලේ අනුකූලතා මට්ටම |
|---|---|
| සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී | ප්‍රධාන විධායක නිළධාරී ගේ කාර්යභාර ය ඉටු කිරිම සභාපතිවරයට මණ්ඩලය මගින් බලය පවරා ඇත. |
| වගකීම<br>විභේදනය | මණ්ඩලයේ නායකත්වය සඳහා සභාපතිවරය වගකිව යුතුයි. විෂේශයෙන්ම සිදුවන කාර්ය ඉටු කරයි.<br>• මණ්ඩලය සම්බන්ධයෙන් කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියාත්මක වීම සහ එහි කමිටු සමඟ උසස් සම්මත වූ ව්‍යවසාය පරිපාලනයක් සුරක්ෂිත කිරිම<br>• සංවර්ධන උපායමාර්ගය තුළ ජ්‍යොෂ්ඨ කළමනාකාරීත්වයට සහයෝගය දැක්වීම සහ වඩාත් පුළුල් වශයෙන්, ජ්‍යොෂ්ඨ කළමණාකාරීත්වයට උපදෙස් ලබාදීම හා සහයෝගය දැක්වීම කළ යුතුය. එක් එක් අංශයන්හි නායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගකිව යුතු අතර මණ්ඩලය මගින් අභිනියෝජනය කළ අධිකාරීන් තුළින් කළමනාකරණය සිදු කළ යුතුය.<br>• මණ්ඩලය මගින් නිර්දේශ කිරීම සඳහා උපායමාර්ග යෝජනා වැඩි දියුණු කිරීම සහ එම සම්මත වූ උපායමාර්ග ව්‍යාපාරය තුළට පරාවර්තනය කිරිම සුරක්ෂිත කිරීම<br>• මණ්ඩලයට සහයෝගය දැක්වීමට මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සම්මත වූ උපායමාර්ග සමඟ වෙනස් නොවන වාර්ෂික සැලසුම් සංවර්ධනය කිරීම<br>• ආයතනයේ සැලසුම් වෙත ළඟා වීමට අවශ්‍ය කරන ධාරිතාවන් සහ සම්පත් සුරක්ෂිත කිරීම සඳහා මානව සම්පත් සැලසුම් කිරීම<br>• සංවිධානාත්මක ව්‍යුහයන් සංවර්ධනය කිරිම සහ කාර්යක්ෂම සංවිධානයන්වල සම්පත් සුරක්ෂිත කිරීම සඳහා පද්ධතීන් සහ ක්‍රියාදාමයන් පිහිටුවීම<br>• සම්මත සැලසුම්,උපායමාර්ගයන් සහ ප්‍රතිපත්තීන් සමඟ ව්‍යාපාරයේ කාර්යසාධනය තුළ සංගතබාවය සඳහා මණ්ඩලයට වගකිව යුතු වීම<br>• කාර්යසාධන සම්බන්ධතාවන් සහ ඇගයුම් සංවර්ධනය ඇතුළත්ව, විධායක කමිටුවට මඟ පෙන්වීම |

| | |
|---|---|
| | • ආයෝජනයේ ප්‍රතිලාභ පාලනය කිරීම |
| ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර් මණ්ඩලය | ජ්‍යෙෂ්ඨ ටෙන්ඩර මණ්ඩලයට සභාපති ඇතුළුව සාමාජිකයන් තිදෙනෙකු අන්තර්ගත වේ. ආයතනයේ සමස්තයම දිගින් දිගට ප්‍රතිසම්පාදනය කිරීමේ ක්‍රියාවලිය සහ ඒ පිළිබඳ හොඳ තීරණ ගැනීමට ජාතික රක්ෂණ භාර අරමුදල විශාල වටිනාකමක් එකතු කිරීම පිළිබඳ මණ්ඩලය පරීක්ෂා කර බලයි. |
| විගණන කමිටුව | විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්ගෙන් සමන්විත වේ. විගණන කමිටුව එහි වගකීම පවත්නා මූල්‍යමය සහ පරිපාලනය තුළ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි.<br><br>**විගණන කමිටුව**<br><br>***2011*** වර්ෂය තුලදී විගණන කමිටුව පිහිටවනු ලැබූ අතර එහි විෂය පථය පහත දක්වා ඇති පරිදි වේ.<br><br>***1.*** අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්චය කරලීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය<br>***2.*** ආයතනයේ සියළුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇගයීම<br>***3.*** පිරිවැය ඵලදායිතාව සඳහා කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය සහ අපතේ යන වියදම් ආදිය දුරලීම<br>***4.*** බාහිර විගණන සමඟ සමායෝගය හා විගණකාධිපතිවරයාගේ බාහිර කළමනාකරණ ලිපිවල සඳහන් උපදෙස් අනුගමනය කිරීම<br>***5.*** අණපනත් නීති රීති සහ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බැව් නිශ්චිත වශයෙන් සොයා දැන ගැනීම<br>***6.*** ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සහතික කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය<br>***7.*** ප්‍රතිකර්ම වශයෙන් පියවර ගැනීම සහතික කරගනු පිණිස අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සමාලෝචනය<br>***8.*** පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම<br><br>2011 වර්ෂය තුළදී විගණන කමිටුව අවස්ථා 06 කදී රැස්ව ඇත. නීති සහ රෙගුලාසිවල යටත් වීම සහතික කිරීම මූල්‍ය වාර්තාකරණය කේන්ද්‍රගත කරගනිමින් ඵලදායි රක්ෂණ වැඩසටහන් කළමනාකරණය සහ මූල්‍යකරණය, බාහිර විගණනය, අවධානම් කළමනාකරණය, අනුකූලතාව දැක්වීම සහ නඩු කීම,අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණනය කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කර ඇත. |

| | |
|---|---|
| මණ්ඩල රැස්වීම් | මණ්ඩලය විසින් මෙහෙයවන ලද මණ්ඩල රැස්වීම් 17 ක් 2011 වර්ෂය තුළ පැවැත්වූ අතර රැස්වීමට සහභාගි වීමේ විශිෂ්ට වාර්තාවක් ද තබන ලදී. අධ්‍යක්ෂකවරුන්ගේ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීමේ තොරතුරු පහත දැක්වේ.<br><br>දිනය / සහභාගි වූ රැස්වීම් ගණන<br>එස්.ඩී. අබේගුණසේකර මහතා 10.05.2010 17<br>සභාපති<br>ආචාර්ය එල්. සමරවික්‍රම මහතා 11.06.2010 17<br>සාමාජික<br>ඒ.කේ. සෙනෙවිරත්න මහතා 08.07.2011 17<br>සාමාජික<br>එන්. කුලසේකර මහතා 18.07.2011 08<br>සාමාජික<br>ජේ. දඩල්ලගේ මහතා 23.06.2010 16<br>සාමාජික<br>ඩබ්.එච්. පියදාස මහතා 10.07.2010 14<br>සාමාජික<br><br>ඔවුන්ගේ නිලය දරන කාලය තුළ රැස්වීම්වලට සහභාගි වීම ඉහත පරිදි වේ.<br><br>මණ්ඩලයේ ප්‍රධානතම කාර්යයන් සහ වගකීම ආවරණය වන පරිදි සකස් කෙරුණු විධිමත් න්‍යාය පත්‍රයක් මත මණ්ඩල රැස්වීම් හසුරුවන ලදී. මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ විචාරය කරන ලද ආයතනයේ පස් අවුරුදු සංයුක්ත සැලැස්ම, ආයතනයේ කළමනාකරණය දෙසට අවශ්‍ය උපායමාර්ගික නියෝගය සපයනු ලදී. |
| විගණනය හා වගකිව යුතු බව | අනුමත කරන ලද ව්‍යාපාරික සැලැස්ම මත ව්‍යාපාරය මෙහෙයවන යෝග්‍ය ආකාරය රඳා පැවතීම හා ආයතනය ළඟා වූ මූල්‍ය සහ මූල්‍ය නොවන ඉලක්ක සුරක්ෂිත කිරීමට ආයතනයේ පරදු දරන්නන් වෙත මණ්ඩලය වගකිව යුතු වේ. |

| | |
|---|---|
| මූල්‍යමය වාර්තාව | සකස් කරන ලද අන්තර්කාලීන සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ මෙන්ම ඉදිරියේදීත් සකස් කරනුයේ ද කාලානුරූප ආකාරයෙනි.<br>රජයේ අවශ්‍යතාව අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අදාලව සහ අනුමැතිය තුළ ආයතනයේ පිරිස සහ මූල්‍ය ප්‍රකාශ සකස් කෙරෙන බවට මණ්ඩලය සුරක්ෂිත වෙයි.<br><br>• **වාර්ෂික වාර්තාව 2011**<br><br>මැනවින් සලකා බලන ලද තීරණ ගැනීම පිණිස 2011 වර්ෂය තුළදී ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතු පිළිබඳ සමස්ත තක්සේරුවක් ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදලේ 2011 වාර්ෂික වාර්තාව සකස් කරනු ලැබ ඇත.<br><br>• **මූල්‍ය ප්‍රකාශ**<br><br>ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව ඉදිරිපත් කරන ලදි. |




# 8. පාලන වාර්තාකරණය- අවධානම් කළමනාකරණය

## හැඳින්වීම

වාසිදායක තත්ත්වයන් වලින් ඵල ප්‍රයෝජන ලබා ගැනීමට අපොහොසත් වීම ඇතුළු ව්‍යාපාරික අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී බලපාන යම් සිදුවීමක් හෝ අස්ථාවරභාවය වශයෙන් "අවදානම" පුළුල් ලෙස අර්ථ දක්වනු ලැබේ. අවදානම ඕනෑම ව්‍යාපාරික ආයතනයකට ආවේනික වන අතර එය තවදුරටත් ඉහළ යනු ලබන්නේ ව්‍යාපාරික පරිසරයේ වට පිටාව තුළය.

ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණය යනු ක්‍රමෝපායික කළමනාකරණයේ ඉතා වැදගත් අංශයක් වේ. ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය මගින් ස්වකීය කාර්යයන්ට සම්බන්ධ අවදානම් වලට ක්‍රමානුකූලව පිළියම් යොදයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ සාර්ථක අවදානම් කළමනාකරණ මූල් පියවර ස්වකීය සම්පූර්ණ විෂය පථය, වෙනස් වන අවස්ථාවන්ට ප්‍රතිචාර දක්වීම මගින් ඇතුලත් කරන ලද දින චර්යා සහ කාර්යයන් සහ ගති ලක්ෂණ හා එකට බැඳුනු අනෙකුත් සමායතනික කාර්යන් ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් මට්ටමට සමානුගතික වේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණය යොමු කරනු ලබන්නේ වැදගත් අවදානම් තක්සේරු කිරීමට සහ යෝග්‍ය අවදානම් ප්‍රතිචාර ක්‍රියාත්මක කිරීමටයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ අරමුණ වන්නේ ආයතනයේ සියළුම කාර්යයන් මගින් උපරිම තිරසාර වටිනාකමක් ලඟාකර ගැනීමයි. ආයතනයට බලපෑ හැකි සාධකවල විභවතාවය ඉහළ පහල යාම පිළිබඳ අවබෝධය ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමනාකරණය මගින් උසස් තත්ත්වයට පත් කරයි. එය සාර්ථක වීමේ හැකියාව ඉහල නංවන අතර, අසාර්ථක වීමේ හැකියාව සහ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම හා සම්බන්ධවී ඇති අස්ථාවර මට්ටම පහත හෙළනු ලබයි.

මිනිසුන් විසින් ක්‍රියාත්මක කරනු ලබන ආයතනයක් හරහා ක්‍රියාත්මක හා ගලායන සෑම මට්ටමකම හා ඒකකයක, ව්‍යාපාරය තුළ ක්‍රම උපාය යෙදීමේදී අදාල කරගනු ලබන්නා වූත් ආයතන මට්ටමේ අවදානම පිළිබඳ සමාලෝචනය ඇතුලත් වන්නාවූත්, විභව්‍ය සිදුවීම් හඳුනා ගැනීම සඳහා, සැලසුම් කර ඇත්තාවූත්, ආයතනයට බලපෑමක් විය හැකි අවදානම තුළම අවධානයට කළමනාකරණය කිරීමත්, ආයතන කළමනාකරණයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට සාධාරණ, සහතිකයක් සපයනු ලැබිය හැකි වන්නා වූත්, සහ එකක් හෝ ඊට වැඩි වෙන වෙනම එහෙත්, උපරිපතන කාණ්ඩයන් වලින් අරමුණු ඉටුකර ගැනීමට යොමුවනු ලබන්නාවූත්, ආයතනයක සෑම මට්ටමකින්ම සිදුවෙමින් පවතින ක්‍රියාවලිය ව්‍යාපාර අවදානම් කළමනාකරණය වේ.

ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාර අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය පහත සඳහන් අන්තර් සම්බන්ධතාවයකින් යුත් සාධක කෙරෙහි අවදානය යොමු කරයි.

**අභ්‍යන්තර පරිසරය -** ජාතික රක්ෂණ භාර අරමුදලේ අභ්‍යන්තර පරිසරය ජාතික රක්ෂණ භාර අරමුදල සංවිධානමය ව්‍යුහය සහ සංස්කෘතියේ ස්වාභාවය ආවරණය කරනු ලබන අතර කළමනාකරණ දර්ශනය සහ අවදානම් නැඹුරුව ඒකාබද්ධතාව සහ ආචාරධර්ම වටිනාකම් ජාතික රක්ෂණ භාර අරමුදල මෙහෙයුම් පරිසරය ඇතුළු ආයතනික පුද්ගලයන් විසින් අවදානම සමාලෝචනය කරන්නේද සහ ඊට කෙසේ පිළියම් යොදන්නේද යන්න සඳහා පදනමක් සලසයි.

**අරමුණ පිහිටුවීම -** අර්ථසිද්ධියට බලපෑමක් කරන විභව සිදුවීමක් කළමනාකරණය විසින් හඳුනා ගැනීමට පෙර ජා.ර.භා.අ.මු. අරමුණ පැවතිය යුතුය. ජා.ර.භා.අ. කළමනාකරණය විසින් අරමුණු නියම කර ක්‍රියාවේ යොදවා ඇති බවටත් තෝරා ගනු ලැබූ අරමුණු ජා.ර.භා.අ. මෙහෙවර සමඟ **එ**කඟ වන බවටත් ව්‍යාපාර අවදානම් කළමනාකරණ ක්‍රමෝපාය සහතික වේ.

**සිදුවීම හඳුනාගැනීම** - ජා.ර.භා.අ. අභිමතාර්ථයන් සාක්ෂාත් කර ගැනීමට බලපෑම් කෙරෙන අභ්‍යන්තර සහ බාහිර සිදුවීම, අවදානම සහ ඉඩ ප්‍රස්ථා වෙන්කොට ගනිමින්, හඳුනා ගනී.


**අවදානම් තක්සේරුව** - සක්‍යතාවය හෝ බලපෑම සැලකිල්ලට ගනිමින් ජා.ර.භා.අ. අවදානම්, ඒවා කෙසේ කළමනාකරණය කළයුතු ද යන්න තීරණය කිරීම සඳහා වූ පදනමක් වශයෙන් විශ්ලේෂණය කරනු ලබයි.

**අවදානම් ප්‍රතිචාරය** - ජා.ර.භා.අ. විසින් කළමනාකරණය අවදානම් ප්‍රතිචාර තෝරා ගනු ලබයි. අවදානම මඟහැරීම, භාර ගැනීම, අඩු කිරීම හෝ හවුලේ දරා ගැනීම ආයතන අවදානම දරා සිටීම සහ අවදානම් නැඹුරුව වෙනස් කිරීම සඳහා පියවර සමුදායක් වර්ධනය කිරීම

**පාලන කාර්යයන්** - අවදානම් ප්‍රතිචාර ඵලදායීව ක්‍රියාත්මක කරනු ලබන බවට තහවුරු කිරීම සඳහා ජා.ර.භා.අ. ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග ස්ථාපිත කර ක්‍රියාත්මක කරනු ලැබේ.

**තොරතුරු සහ සන්නිවේදනය** - ජනතාවට ස්වකීය වගකීම් ක්‍රියාත්මක කිරීමට හැකිවන පරිදි ආකෘතියකින් සහ කාලරාමුවකින් ජා.ර.භා.අ. අදාළ තොරතුරු හඳුනාගැනීම, ග්‍රහණය කර ගැනීම සහ සන්නිවේදනය කිරීම කරනු ලබයි. ආයතනයක පහළට තිරස් අතට සහ ඉහළට පුළුල් ආකාරයට සඵලදායි සන්නිවේදනයක් ද සිදුවේ.

**අධීක්ෂණය** - ජා.ර.භා.අ. ක්‍රමෝපාය අධීක්ෂණය කරනු ලබන අතර අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කර ඇත. ක්‍රියාත්මක වන කළමනාකරණ කාර්යයන් වෙනත් ඇගයීමක් හෝ දෙකම මගින් අධීක්ෂණය ඉටු කරනු ලැබේ.




## අවදානම් කළමනාකරණයේ වගකීම

අධ්‍යක්ෂ මණ්ඩලය සහ විගණන කමිටුව විසින් එහි වගකීම්වල කොටසක් වශයෙන් අවදානම් කළමනාකරණ ක්‍රමඋපාය තීරණය කිරීම සම්බන්ධයෙන් වගකිය යුතුය. අවදානම් සහ අභ්‍යන්තර පාලනය මෙන්ම, සේවකයින්ට ආයතනයේ ක්‍රමඋපාය දැනුම්දීම අධීක්ෂණය කිරීම සම්බන්ධයෙන්ද වගකිය ඇත.

ශක්‍යතාවය (සංඛ්‍යාතය) පිළිබඳ තක්සේරුව සහ බලපෑම ප්‍රමාණකරණය (ප්‍රතිඵලය) අනුව හඳුනාගනු ලැබූ අවදානම් ප්‍රමුඛතාවයට පත් කරනු ලැබේ.

## R 01 - උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අභිමතාර්ථ ඉටු කර ගැනීමට නොහැකි වීම උපාය මාර්ගික අවදානම වශයෙන් හඳුන්වනු ලැබේ.උපායමාර්ගික අභිමතාර්ථ ඉටුකිරීම සහතික කරනු වස් ජාතික රක්ෂණ භාර අරමුදලේ කළමනාකාරිත්වය විසින් සාමාන්‍ය පරිසරය තුළ දේශපාලනික, තාක්ෂණික,සමාජ සංස්කෘතික ආර්ථික සංවර්ධනයන් සහ ජාතිකරක්ෂණ භාර අරමුදලේ ක්‍රම උපායික අභිප්‍රායට බලපෑමක් විය හැකි රක්ෂණ අංශයට අදාළ ශ්‍රී ලංකාවේ කාර්යභාර පරිසරය තුළ තරඟකරුවා සහ පාරිභෝගිකයාගේ වෙනස්වීම් අධීක්ෂණය කිරීම මගින් මෙම තත්වය කළමණාකරණය කරනු ලබයි.

## R 02 - වෙළඳ යටත්වීම් අවදානම

යටත්වීමේ අවධානම යනු ව්‍යාපාරයක් අත්හිටුවීමේ හෝ ව්‍යාපාරික ක්‍රියාකාරකම් අතරමැද නැවැත්වීමේදී සහ එසේ බිඳවැටීමේ ප්‍රතිඵලයක් වශයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට අදාල නීති, කොන්දේසි, අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ සැකැස්මට හෝ ආචාරධර්ම සම්මතයන්ට හානියක් සිදුවීමෙන් පාරිභෝගිකයන්ට අහිතකර බලපෑමක් ඇතිවීමෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ කීර්තියට හානි සිදුවීමේ අවධානමයි. ජාතික රක්ෂණ භාර අරමුදල, මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වැනි විවිධ පාලන ආයතන විසින් නියමකරනු ලැබූ නීති, රීති සහ කොන්දේසි පිළිපැදීම මගින් යටත්වීමේ අවධානම අවම කරගනී.

## R -03 - ජාත්‍යන්තර වෙළඳ අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රතිරක්ෂණ සහ විදේශ රැකියා රක්ෂණ කාර්යයේ නිරත වී සිටින බැවින් ජාත්‍යන්තර ජාත්‍යාන්තර දේශපාලන සහ වෙළඳාම ජාතික රක්ෂණ භාර අරමුදලට බලපානු ලබයි. එබැවින් ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවකයින් සංකේන්ද්‍රණය වී සිටින මැදපෙරදිග රට වල උපනතීන් අධීක්ෂණය කිරීමෙන් හා ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශයට අදාළ ජාත්‍යන්තර කටයුතු වල උපනතීන් අධීක්ෂණය කිරීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් එකී අවදානම අවම කර ගනු ලබයි.

## R 04 - ප්‍රාරක්ෂණ අවදානම

2011 වර්ෂයේදී, සිදුවිය හැකි ව්‍යසන සිද්ධීන් නිසා ඉහල යන හිමිකම් පිරිවැයෙහි බර ලිහිල් කිරීම පිණිස ප්‍රතිරක්ෂණ වැඩසටහනක් ගිවිසුමකට ඇතුළත් විය.

## R 05 - සමායතනික ප්‍රතිරූප අවදානම

නිශ්චිත සිදුවීමක් හෝ චර්යාවක් නිසා ජාතික රක්ෂණභාර අරමුදලේ සන්තම් සමානාත්මතාවය හානියට පවත්වන්නේ නම් සමායතනික ප්‍රතිරූප අවධානම හටගනී. ජාතික රක්ෂණ භාර අරමුදලට අදාළ වන සියලු ම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම මගින් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් කීර්ති නාම අවධාන ම අවම කර ගනී. ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරූපය, ප්‍රචාරණය , සහභාගිත්ව ප්‍රදර්ශන සහ ජාතික රක්ෂණභාර අරමුදලේ සමායතනික ප්‍රතිරූපය ඉහළ නංවන්නාවූ පාරිභෝගිකයන් සෑහිමකට පත්වන්නාවූ සේවාවක් ලබාදීම වැනි අලෙවිකරණ කාර්යයන් කීපයක් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ක්‍රියාත්මක කරයි.එසේම නීති සහ රෙගුලාසි වලට අනුකූල වීම සියළුම සේවකයින්ට නියම කරමින් මණ්ඩලයේ අනුමැතිය ඇතිව ජනතාවට මූල්‍ය තොරතුරු මුදා හැරීමටද ජාතික රක්ෂණභාර අරමුදල විසින් ඉඩකඩ සලසයි.

## R – 06 මානව සම්පත් අවදානම

මානව සම්පත් අංශයේ ප්‍රධානම අවදානම වන්නේ, රක්ෂණ ව්‍යාපාරයේ වෘත්තීය සුදුසුකම් සහිත පිරිසෙහි හිඟය වනු ඇත. සෑම අතින්ම සේවකයන් සංවර්ධනය කරමින් සහ අඛණ්ඩව අධ්‍යාපනය ලබා දෙමින් 2011 වර්ෂයේදී, මානව සම්පත් අවධානම අවම කර ඇත.

## R - 07 අලෙවි / ව්‍යාපාරික අවදානම.

ව්‍යාපාර කිහිපයක් මත පමණක් සංකේන්ද්‍රණය වීමෙන් ව්යාපාර අවදානම ඇතිවේ. වැඩ වර්ජන කැරලි, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදල, ප්‍රතිරක්ෂණය, මෝටර් වාහන රක්ෂණය විවිධාංගීකරණය වීම හරහා මෙකී අවදානම ලිහිල් කර ඇත.

*R – 08* විදේශ විනිමය ඉහල පහල යාමේ අවධානම

විදේශ විනිමය ඉහල පහල යාමේ අවධානම කළමනාකරණය කිරීම උදෙසා ජාතික රක්ෂණ භාර අරමුදල කටයුතු කර ඇත

විදේශ වෙළඳාම නිසා විදේශ විනිමය ගණු දෙනු අවදානම ඇති වෙයි. දේශ විනිමය ගනුදෙනු අවදානම ඉවත් කර ගැනීමපිණිස, ප්‍රතිරක්ෂණ වාරිකය ගෙවීම සඳහා දේශීය මුදලේ වටිනාකමින් ප්‍රතිරක්ෂණ ගිවිසුම් වලට එළඹ ඇත.

*R – 09* තොරතුරු තාක්ෂණ උපායමාර්ග සහ කළමනාකරණ අවදානම

ජාතික රක්ෂණ භාර අරමුදලේ දත්ත සහ පවත්නා තොරතුරු , තොරතුරු තාක්ෂණ අවදානම මගින් අත් කර ගෙන ලබා දෙයි. යටිතල පහසුකම් හා දත්ත පද්ධති අංග මගින් සම්පූර්ණ කරන ලද තොරතුරු තාක්ෂණ අවදානම් ලිහිල් කිරීමේ සැලැස්ම, තොරතුරු ආරක්ෂාව, අධිකත්වය සහ සුලභතාවය මගින් තොරතුරු තාක්ෂණික අවදානමට එරෙහිව ජාතික රක්ෂණ භාර අරමුදල කටයුතු කරයි. අපගේ සේවා දායකයින්ට නිවැරදි සහ පවත්නා තොරතුරු තාක්ෂණ සේවා ලබා දීම සඳහා ක්‍රියාවට නංවනු ලැබූ කුඩා පරිමාණයේ ආපදා ප්‍රතිසාධන සැලැස්ම ඇතුළුව ඇති ප්‍රති වෛරස් සහ දත්ත සුරක්ෂිත කිරීමේ විසඳුම වැනි සේවා තොරතුරු තාක්ෂණික දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලදි.

R -10 ණය අවදානම

ආයෝජන ණය අවදානම යනු ආයෝජනය කරන ලද ප්‍රාග්ධනය සහ පොලිය අය කර ගැනීමට නොහැකිවීමයි. භාණ්ඩාගාර බිල්පත් REPOS සහ භාණ්ඩාගාර බැඳුම් කර වල ණය අවදානම රහිත ආයෝජන මගින් මෙම අවදානම අවම කරනු ලබයි. රජයේ බැඳුම් කර වල ආයෝජනය කිරීම ජාතික රක්ෂණ භාර අරමුදල් පනතින් තහනම් කර ඇති බැවින් ආයෝජන රජයේ බැංකු මගින් පමණක් සිදු කරනු ලබයි.

*R – 1 1* මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම මෙහෙයුම් පරිගණක ගත කිරීම මගින් ලිහිල් කරනු ලැබේ. වාරික එකතු කිරීමේ සහ හිමිකම් පෑම් ගෙවීමේ දෝෂ සහ වෙනස්කම් අවමකරගැනීම පිණිස අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් ජාතික රක්ෂණ භාර අරමුදලේ වැඩ වර්ජන කැරලි, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදල, නැගිටීම් සහ ත්‍රස්තවාද පනතේ සහ අනෙකුත් දෙපාර්තමේන්තුවල අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. තවද දෝෂ සහ වෙනස්කම් අවමකර ගැනීම පිණිස කාර්යාලීය මෙහෙයුම් පරිගණකගත කර ඇත

*R – 12* සංකේන්ද්‍රණය වීමේ අවදානම

මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව වැනි බොහෝ බැංකුවලට ආයෝජනය විවිධාංගිකරණය කිරීම හරහා සංකේන්ද්‍රණය වීමේ අවදානම අඩුකර ඇත.

*R – 13* ද්‍රවශීලතා අවදානම

*REPOS* විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බිල්පත්, විවිධ කල්පිරීම් සහිත භාණ්ඩාගාර බැඳුම්කර සහ ඇපකර වැනි ආයෝජන විවිධාංගිකරණය විවිධ කල් පිරීම් සහිත ආයෝජන හරහා ද්‍රවශීලතාවය/හෝ හිමිකම් ගෙවීම් ප්‍රතිරක්ෂණ ගෙවීම් සහ භාණ්ඩාගාරයට අරමුදල් මාරුකර යැවීම් වැනි ගිවිසුම්ගත වගකීම් සපුරාලීමට නොහැකි වීම ලිහිල් කර ඇත.

*R – 14* හිමිකම්පෑම පියවීමේ අවදානම

හිමිකම් පෑම් අනුමත කිරීමේදී සහ හිමිකම් පෑම් ක්‍රියාවලියේදී රාජකාරි බෙදීමේදී අනුල්ලංඝනීය රෙගුලාසි පැනවීම සඳහා ආරම්භක පියවර ගැනීම මගින් වංචනික, නීති විරෝධි, තාක්ෂණික සාධක නිසා පැන නැඟිය හැකි ආරවුල් පිළිබඳ අවදානම පාලනය කරනු ලබයි




# 09.මූල්‍ය ප්‍රකාශ - 2011

# ආදායම් හා වියදම් ප්‍රකාශය

**ආදායම් හා වියදම් ප්‍රකාශය** *(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා*

| | සටහන | **2011** අග්‍රහාර හා වෙනත් | **2011** **SRCC & Tr.** | **2011** මුලු ගණන | 2010 මුලු ගණන |
|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | |
| ශුද්ධ ඉපැයූ වාරික ආදායම | **01** | 1,741,713,258 | 1,864,651,774 | **3,606,365,031** | 3,926,469,856 |
| **ප්‍රතිලාභ, පාඩු හා වියදම්** | | | | | |
| රක්ෂණය, හිමිකම් පෑම් හා ප්‍රතිලාභ | **02** | (1,717,209,790) | (162,276,907) | **(1,879,486,696)** | (2,292,072,983) |
| | | 24,503,468 | 1,702,374,867 | **1,726,878,336** | 1,634,396,.873 |
| **අනෙකුත් ආදායම්** | | | | - | - |
| ආයෝජන ආදායම | | 106,516,361 | 616,895,880 | **723,412,241** | 798,117,037 |
| මෘදු ණය මත වූ පොලිය | | - | 10,163,846 | **10,163,846** | 16,982,331 |
| වෙනත් ආදායම් | | 555,784 | 187,830 | **743,614** | 1,006,353 |
| | | 107,072,145 | 627,247,556 | **734,319,701** | 816,105,721 |
| **වියදම්** | | | | - | - |
| කාර්ය මණ්ඩලයට අදාළ වියදම් | **03** | 54,748,938 | 1,251,916 | **56,000,854** | 43,873,415 |
| පරිපාලන වියදම් | **04** | 60,373,264 | 8,542,286 | **68,915,550** | 43,588,622 |
| මූල්‍ය හා වෙනත් | **05** | 6,144,596 | 15,437,330 | **21,581,925** | 32,425,697 |
| **මුලු වියදම** | | 121,266,798 | 25,231,533 | **146,498,329** | 119,887,735 |
| **වියදම ඉක්මවූ ආදායම** | | 10,308,816 | 2,304,390,891 | **2,314,699,707** | 2,330,614,859 |

# ශේෂ පත්‍රය

ජාතික රක්ෂණ භාර අරමුදල

ශේෂ පත්‍රය

*සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි*

*දෙසැම්බර් 31 වන විට*

| | සටහන | 2011 අග්‍රහාර හා වෙනත් | 2011 SRCC & Tr. | 2011 මුලු ගණන | 2010 මුලු ගණන |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල පිරියත හා උපකරණ | 06 | 22,994,316 | 6,612,561 | **29,606,877** | 36,096,011 |
| අයෝජන | | 1,260,159,657 | 3,184,386,606 | **4,444,546,263** | 5,574,107,464 |
| | | 1,283,153,973 | 3,190,999,167 | **4,474,153,140** | 5,610,203,475 |
| **ජංගම වත්කම්** | | | | | |
| ලැබිය යුතු අය | 07 | 363,301,018 | 1,564,513,547 | **1,927,814,565** | 1,945,815,895 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 08 | 285,279,676 | 3,257,690,270 | **3,542,969,946** | 3,594,104,553 |
| | | 648,580,694 | 4,822,203,817 | **5,470,784,511** | 5,539,920,448 |
| **මුලු වත්කම්** | | 1,931,734,667 | 8,013,202,984 | **9,944,937,651** | 11,150,123,923 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | | | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | | | |
| සමුච්චිත අරමුදල | 09 | 1,713,638,127 | 6,783,811,580 | **8,497,449,707** | 9,695,467,155 |
| | | 1,713,638,127 | 6,783,811,580 | **8,497,449,707** | 9,695,467,155 |
| **තාක්ෂණික සංචිත** | | | | | |
| නොපැයූ වාරික | 10 | - | 963,443,837 | **963,443,837** | 821,564,805 |
| විලම්බිත කොමිස් මුදල | 11 | - | (161,486,715) | **(161,486,715)** | (139,745,300) |
| | | - | 801,957,122 | **801,957,122** | 681,819,505 |
| **බැරකම්** | | | | | |
| **ජංගම බැරකම්** | | | | | |
| ආණ්ඩුවේ පරිත්‍යාග | | 142,150 | - | **142,150** | 284,330 |
| ගෙවිය යුතු ලාභ කොමිස් මුදල් | 12 | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| | | 142,150 | 12,287,375 | **12,429,525** | 12,571,706 |
| **ජංගම නොවන බැරකම්** | | | | | |
| ගෙවිය යුතු හිමිකම් පෑම් | 13 | 160,441,865 | 231,968,907 | **392,410,772** | 518,000,208 |
| වෙනත් ගෙවිය යුතු දේ | 14 | 57,512,524 | 183,177,998 | **240,690,522** | 242,265,350 |
| | | 217,954,389 | 415,146,905 | **633,101,294** | 760,265,558 |
| **මුලු ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | | 1,931,734,666 | 8,013,202,983 | **9,944,937,649** | 11,150,123,923 |

මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූල බවට මම සහතික කරමි.

..................................

මූල්‍ය කළමණාකාර

මූල්‍ය ප්‍රකාශ සකස් කිරීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකියනු ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවට 1..................................

2..................................

# සමුච්චිත අරමුදලේ වෙනස්කම් ප්‍රකාශය

*දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* *(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

| | 2011 අග්‍රහාර සහ වෙනත් | 2011 SRCC & Tr. | 2011 මුළු ගණන | 2010 මුළු ගණන |
|---|---|---|---|---|
| **සමුච්චිත අරමුදල** | | | | |
| 2010.12.31 දිනට සමුච්චිත අරමුදල | 1,721,046,466 | 7,974,420,689 | 9,695,467,155 | 9,364,852,296 |
| පූර්ව වාර්ෂික ගැලපීම | (17,717,155) | | | |
| අඩුකළා. ඒකාබද්ධ අරමුදල දායකත්වය | | (3,495,000,000) | (3,495,000,000) | (2,000,000,000) |
| වියදම් ඉක්ම වූ ආදායම | 10,308,816 | 2,304,390,891 | 2,314,699,707 | 2,330,614,859 |
| 2011.12.31 දිනට සමුච්චිත අරමුදල | 1,713,638,127 | 6,783,811,580 | 8,515,166,862 | 9,695,467,155 |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| මූල්‍ය ප්‍රවාහ ප්‍රකාශය | | *සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි* |
|---|---|---|
| *දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | | |
| | **2011** | 2010 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ඇතිවූ මුදල් ප්‍රවාහ** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභ | **2,314,699,707** | 2,338,275,128 |
| අඩකලා වර්ෂපූර්ණ ගැලපීම් | **(17,717,155)** | - |
| අඩු කළා ඒකාබද්ධ අරමුදලට කරනු ලැබූ දායකවීම | **(3,495,000,000)** | (2,000,000,000) |
| | **(1,198,017,448)** | 338,275,128 |
| ***ගැලපීම්*** | | |
| ක්ෂය වීම් | **12,182,858** | 12,348,990 |
| ආයෝජන ආදායම් | **(723,412,241)** | (798,117,037) |
| නොඉපයූ රක්ෂණ වාරික ආදායම් | **141,879,032** | (225,260,471) |
| විලම්භිත කොමිස් | **(21,741,415)** | 60,394,237 |
| ***කාරක ප්‍රාග්ධනය වෙනස්වමට පෙර මෙහෙයුම් ලාභය*** | **(1,789,109,214)** | (612,359,154) |
| අයවිය යුතු දෙයෙහි අඩු වීම් (වැඩිවීම) | **18,001,331** | 133,754,524 |
| ගෙවිය යුතු හිමිකම්වල අඩුවීම් | **(125,589,435)** | (51,474,775) |
| රජයේ ප්‍රධාන අඩුවීම් | **(142,185)** | 188,500,287 |
| ගෙවිය යුතු හිමිකම්වල අඩුවීම් | **(1,574,828)** | 56,571,218 |
| ගෙවිය යුතු වෙනත් දේවල් අඩුවීම | | |
| **මෙහෙයුම ක්‍රියාකාරකමවලින ලත ශුද්ධ මුදල් ප්‍රමාණ** | **(1,898,414,326)** | 285,007,900 |
| ***ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහ*** | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | **(5,693,724)** | (4,841,497) |
| ආණ්ඩුවේ සුරැකුම්පත්වල ආයෝජන | **(1,129,561,201)** | 2,975,663,910 |
| ආයෝජන ආදායම | **723,412,241** | 798,117,037 |
| **ආයොජනය කරමෙ ක්‍රියාකාරකම සඳහා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | **1,847,279,718** | 3,768,939,450 |
| **මුදල් හා මුදල් සමකයන්හි ශුද්ධ වැඩිවීම්/අඩුවීම්** | **(51,134,608)** | 3,483,931,550 |
| **කාල පරිච්ඡේදය ආරම්භයේ, මුදල සහ මුදල් සමකයන්** | **3,594,104,553** | 110,173,003 |
| **කාල පරිච්ඡේදය අවසානයේ, මුදල සහ මුදල් සමකයන්** | **3,542,969,945** | 3,594,104,553 |
| ***මුදල් හා මුදල් සමකයන්හි විශ්ලේෂණය*** | | |
| අතේ ඇති මුදල් හා බැංකු ශේෂ | **303,644,905** | 53,631,851 |
| කෙටිකාලීන ආයෝජන | **3,239,325,039** | 3,540,472,702 |
| මුදල් හා මුදල් සමකයන් | **3,542,969,944** | 3,594,104,553 |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති

## 1.0 සමායතනික තොරතුරු

ජාතික රක්ෂණ භාර අරමුදල ('අරමුදල') "2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතින්" සංස්ථාගත කරන ලදුව, ශ්‍රී ලංකාව තුළ නිත්‍ය වශයෙන් පිහිටුවනු ලැබ ඇත. සමාගමේ ලේඛනගත කාර්යාලය කොළඹ 10, මරදාන පාර අංක 97 දරන ස්ථානයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද මෙකී ලිපිනයෙහි පිහිටා තිබේ.

මෙහෙයුම් වර්ෂය තුළ 2009 අගෝස්තු මස 20 දින 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදලේ (උ) කොටසේ (ඌ) ඡේදයේ නියමය අනුව අංක 1615/20 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් මෙම අරමුදල සිය සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු පෞද්ගලික අංශයට ද ව්‍යාප්ත කර ඇත.

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ සාමාන්‍යයෙන් පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබනුයේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවක් මේ ගිණුම්වලට ඇතුළත් කෙරී නොමැත.

අදාළ විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කරනු ලැබ ඇත.

### 2.2 තුලනාත්මක අගයන්

අරමුදල විසින් දිගටම අදාළ කෙරුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයන්හි භාවිත කෙරුණු පිළිවෙත් වලට අනුකූල වේ. අවශ්‍ය තන්හි දී ඉකුත් වර්ෂයේ අගයන් යළි පෙළගස්වා මේ වර්ෂයේ ඉදිරිපත් කිරීමට ඇතුළත් කෙරී ඇත.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරිය....)

### 2.3 ප්‍රාග්ධන බැඳීම

ශේෂ පත්‍රයෙහි දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබිණි.

### 2.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහන ප්‍රකාශය පිළියෙළ කරනු ලැබ ඇත්තේ "අනියම් ක්‍රමවේදයක්" භාවිතයෙනි.

### 2.5 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු කිසිවක් නොතිබිණි.

### 2.6 පශ්චාත් ශේෂ පත්‍ර කාර්යදාම

සියලුම පශ්චාත් ශේෂපත්‍ර කාර්යදාමයන් සැලකිල්ලට භාජනය කරන ලදුව අදාළ තන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ඒ ඒ සටහන්වල ගැළපීම් හෝ කරුණු අනාවරණය කිරීම් ඇතුළත් කරනු ලැබ තිබේ.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරිය....)

**2.7 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම**

**2.7.1 දේපළ, පිරියත හා උපකරණ**

දේපළ පිරියත හා උපකරණ ඒවායෙහි පිරිවැය අනුව සටහන් ගත කොට තිබේ.

දේපළ, පිරියත සහ උපකරණ යනු එකී වත්කම්, එහි අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරී තත්ත්වයන්ට පමුණුවාලීමේදී වැයවුණු කිසියම් වියහියදම් සමඟ ඒවායෙහි ගැනුම් මිල වෙයි.

අරමුදල පවත්වාගෙන යාම සඳහා තිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම දීර්ඝ කරලීම හෝ වැඩි දියුණු කරලීම සඳහා වැය වූ වියහියදම්.

**ක්ෂයවීම්**

සියලුම දේපළ, පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ ඒවායෙහි ගණන් බලා ඇති, ප්‍රයෝජනවත් ජීවිත කාලයට වැඩි ප්‍රමාණය පහත සදහන් පරිදි සමාන වාර්ෂික කොටස් මුදල් වලින් කපාහරිනු පිණිස ඒවායෙහි වටිනාකම මත සෘජු රේඛා පදනම යොදා ගනිමිනි.

| | |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | - අවුරුදු 10කට වැඩි |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - අවුරුදු 08කට වැඩි |
| කාර්යාල උපකරණ | - අවුරුදු 06කට වැඩි |
| පරිගණක | - අවුරුදු 05කට වැඩි |
| මෝටර් වාහන | - අවුරුදු 05කට වැඩි |

# ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරිය....)

### 2.7.2 ආයෝජන

පිරිවැය අනුව ආයෝජන දක්වා ඇත.

### 2.7.2 ලැබිය යුතු දෑ

වාරික පොළිය සහ අනෙකුත් ලැබිය යුතු දෑ එකතු කර ගැනීමට ඇති හැකියාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම් මත සමාලෝචනය කරනු ලැබේ.

ණය ගැතියන් සහ එකතු කර ගැනීමට අපහසු ලෙස හඳුනාගෙන ඇති අනෙකුත් ලැබිය යුතු දෑ කපාහරිනු ලැබේ.

### 2.7.3 මුදල් හා මුදල් සමකයන්

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යය සඳහා මුදල් සහ මුදල් සමකයන් අතැති මුදල් සහ ශුද්ධ නොගෙවූ බැංකු අයිරා සම්බන්ධයන් වූ බැංකු තැන්පතුවලින් සංයුක්ත වේ.

## 2.8 බැරකම් හා ප්‍රතිපාදන

### 2.8.1 නොඉපයූ වාරික

නොඉපයූ වාරික යනු ශේෂ පත්‍රයෙහි දිනට පසුව යෙදුණු අවදානම් කාල පරිච්ඡේදයට අදාළ වන වර්ෂයක් තුළ දී ලිඛිත වාරිකවල සමානුපාතයන් මේ නොඉපයූ වාරික දළ වාරිකයෙහි 24 වැනි පදනම මත ගණනය කෙරේ.

### 2.8.2 විලම්බිත කොමිස් මුදල

විලම්බිත කොමිස් මුදලෙන් පෙන්නුම් කෙරෙනුයේ නොඉපයූ වාරිකයට අදාළ ශුද්ධ කොමිස් මුදලය.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරිය....)

### 2.8.3 ලාභ කොමිස් මුදල

ලාභ කොමිස් මුදල ගණනය කොට වාරික දෙකකින් ගෙවනු ලැබේ. පළමු වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී සය මසකින් සහ දෙවැනි වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී දොළොස් මසකින් ගෙවනු ලැබේ.

### 2.8.4 ගෙවීමට ඇති හිමිකම්පෑම

හිමිකම්පෑම් අදාළ මුදල් වර්ෂය තුළ දී නොගෙවන අනුමත හිමිකම්පෑම් වලින් ද අරමුදලෙහි සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කෙරෙන ගෙවීමට ඉතිරිව ඇති හිමිකම්පෑම් සඳහා කෙරෙන ප්‍රතිපාදනවලින් සහ ප්‍රතිරක්ෂණය සහ ගොඩගැනුම් අයකර ගැනීම් වෙතොත් ඒ සඳහා අදාළ වියදම් හා ඒ වෙනුවෙන් කෙරෙන ප්‍රතිපාදනවලින් ද සංයුක්ත වේ.

### 2.8.5 අනෙකුත් ගෙවිය යුතු දෑ

අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායෙහි පිරිවැයෙහි දක්වා ඇත.

### 2.8.6 වෙනත් ප්‍රතිපාදන

ශේෂ පත්‍රයෙහි දිනට හඳුනාගත් සියලුම ප්‍රතිපාදන සඳහා ගිණුම්වල පූර්ණ වශයෙන් ඉඩ සලසා ඇත.

# ගිණුම්කරණ ප්‍රතිපත්ති (ඉතිරිය....)

## 2.9 ආදායම් හා වියදම්

### 2.9.1 ආදායම

ආර්ථික ප්‍රතිලාභ, අරමුදල කරා ගලා ඒමට ඉඩකඩ පැවැත්මේ සහ ආදායම විශ්වසනීය අයුරින් මුදාගත හැකිවීමේ ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙරාතුව මතු දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ උපමාන ද සපුරාලීම අනිවාර්ය වෙයි.

**(අ) වාරික දායකත්වය**

වාරික දායකත්වය ඒවා ගෙවීම් කළ යුතු කාලය එළඹීමේදී හඳුනාගනු ලැබේ.

**(ආ) පොලී ආදායම**

ඉදිරියේදී එකතුකර ගැනීම් සැකසහිත වෙතොත් මිස පොලිය උපචිතවීමේදී පොලී ආදායම හඳුනාගනු ලැබේ.

**(ඇ) වෙනත්**

### 2.9.2 වියදම් හඳුනාගැනීම

අරමුදල පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙහි පවත්වාගෙන යාමේදී වැය වන සියලුම වියදම් ද අතිරික්තය ලබා ගැනීමේදී ආදායමට බැර කරනු ලැබ ඇත.

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්

**මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන්** *සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි*

*දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය*

| | 2011<br>අග්‍රහාර හා වෙනත් | 2011<br>SRCC & Tr. | 2011<br>එකතුව | 2010 |
|---|---|---|---|---|
| **01 ඉපැයූ ශුද්ධ වාරික ආදායම** | | | | |
| සාමාජිකයන්ගේ සහභාගි | 623,424,037 | - | **623,424,037** | 595,140,400 |
| භාණ්ඩාගාරයෙන් ලද සහභාගි | 494,229,000 | - | **494,229,000** | 442,790,000 |
| වාරික ආදායම - මෝටර් | 215,199,457 | - | **215,199,457** | 237,386,267 |
| වාරික ආදායම - ප්‍රතිරක්ෂණය | 198,551,912 | - | **198,551,912** | 296,078,296 |
| වාරික ආදායම - පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් | 10,000,000 | - | **10,000,000** | 10,000,000 |
| වාරික ආදායම - විදේශ සේවා නියුක්තිය | 208,799,952 | - | **208,799,952** | 231,968,216 |
| වාරික ආදායම - පොදු රක්ෂණය | 170,876,837 | - | **170,876,837** | 149,796,387 |
| ලබන ලද දළ SRCC & TR වාරික | - | 2,006,556,886 | **2,006,556,886** | 1,874,425,103 |
| වාරික ආපසු ගෙවීම් | - | (26,080) | **(26,080)** | (4,194,863) |
| **දළ ලිඛිත වාරික** | 1,921,081,195 | 2,006,530,806 | **3,927,612,001** | 3,833,389,806 |
| ප්‍රතිරක්ෂණ වාරික | (179,367,937) | - | **(179,367,938)** | (132,180,421) |
| **ශුද්ධ ලිඛිත වාරික** | 1,741,713,258 | 2,006,530,806 | **3,748,244,064** | 3,701,209,385 |
| නොඉපයූ වාරික සඳහා සංචිතවල සිදුවූ ශුද්ධ වෙනස | - | (141,879,033) | **(141,879,032)** | 225,260,471 |
| | 1,741,713,258 | 1,864,651,773 | **3,606,365,032** | 3,926,469,856 |
| **02 ප්‍රතිලාභ, පාඩු සහ වියදම්** | | | | |
| උපැස් | 180,748,334 | - | **180,748,334** | 171,198,748 |
| ආරෝග්‍ය ශාලා ගාස්තු | 592,182,669 | - | **592,182,669** | 497,586,183 |
| ප්‍රසව | 106,577,025 | - | **106,577,025** | 92,391,681 |
| හදිසි අනතුරු | 21,702,772 | - | **21,702,772** | 21,090,442 |
| වෛද්‍ය ගාස්තු | 23,382,719 | - | **23,382,719** | 33,195,607 |
| හෘද රෝග | 136,497,358 | - | **136,497,358** | 118,423,376 |
| පිළිකා | 11,265,221 | - | **11,265,221** | 25,415,064 |
| සාමාන්‍ය හා හදිසි අනතුරු මරණ | 162,837,751 | - | **162,837,751** | 117,405,559 |
| මෝටර් හිමිකම් | 127,633,818 | - | **127,633,818** | 151,555,078 |
| විදේශ රැකියා හිමිකම් | 182,688,549 | - | **182,688,549** | 160,963,358 |
| ප්‍රතිරක්ෂණ හිමිකම් වියදම් | 58,145,812 | - | **58,145,812** | 202,732,501 |
| වෛද්‍ය රක්ෂණ පා.ම. | 9,419,786 | - | **9,419,786** | 6,951,417 |
| වෛද්‍ය රක්ෂණ හිමිකම්පෑම් - පොදු රක්ෂණය | 96,419,651 | | **96,419,651** | 10,598,492 |
| උපචිත ශුද්ධ හිමිකම් (SRCC & TR) | - | (141,693,868) | **(141,693,868)** | 303,486,061 |
| ශුද්ධ කොමිස් | 7,708,325 | 303,970,775 | **311,679,100** | 379,079,417 |
| | 1,717,209,790 | 162,276,907 | **1,879,486,697** | 2,292,072,983 |
| **03 කාර්ය මණ්ඩල පිරිවැය** | | | | |
| දළ වැටුප් | 37,855,354 | 928,197 | **38,783,551** | 33,144,287 |
| සේවක අර්ථ සාධක - 12% | 5,597,277 | 104,184 | **5,701,462** | 3,241,705 |
| සේවා නියුක්තිකයන්ගේ භාර | 1,448,310 | 26,046 | **1,474,357** | 718,647 |
| අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 397,571 | - | **397,571** | 553,393 |
| වාර්ෂික ප්‍රසාද මුදල | 3,020,817 | - | **3,020,817** | 2,440,000 |
| වෙනත් දීමනා | 2,304,515 | 193,489 | **2,498,004** | 1,218,283 |
| අනියම් වැටුප් | 893,414 | - | **893,414** | 1,009,717 |
| පාරිතෝෂික වියදම් | 1,003,706 | | **1,003,705** | |
| කාර්යමණ්ඩලය සඳහා පුහුණු කිරීම් | 789,575 | | **789,575** | 611,471 |
| කාර්යමණ්ඩල සුබසාධන වියදම් | 1,438,399 | | **1,438,399** | 935,912 |
| | 54,748,938 | 1,251,916 | **56,000,854** | 43,873,415 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් (ඉතිරිය)

**මූල්‍ය ප්‍රකාශ පිළිබද සටහන්** *සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි*

*දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය*

| | 2011<br>අග්‍රහාර හා වෙනත් | 2011<br>SRCC & Tr. | 2011<br>එකතුව | 2010 |
|---|---|---|---|---|
| **04 පරිපාලන වියදම්** | | | | |
| ගමන් වීයදම් | 314,312 | 3,220 | **317,532** | 177,773 |
| ක්ෂය වීම් | 8,959,343 | 3,322,265 | **12,281,608** | 12,348,990 |
| කුළී | 3,491,492 | 3,000,000 | **6,491,492** | 2,989,145 |
| ජලය | 466,522 | - | **466,522** | 301,218 |
| විදුලිය | 3,696,368 | - | **3,696,368** | 3,131,932 |
| දුරකථන | 1,522,672 | 28,053 | **1,550,725** | 1,092,359 |
| මුද්‍රණය සහ ලිපිද්‍රව්‍ය | 5,284,550 | - | **5,284,550** | 3,770,600 |
| කාර්යාල නඩත්තුව | 6,705,080 | 2,631 | **6,707,712** | 5,424,755 |
| සනීපාරක්ෂක නඩත්තුව | 276,326 | - | **276,326** | 1,795 |
| තක්සේරු කිරීම හා පිරික්සුම් | 2,799,405 | 697,846 | **3,497,251** | 2,827,975 |
| දැයට කිරුළ වියහියදම් | 3,649,979 | - | **3,649,979** | 579,500 |
| පරිත්‍යාග | 7,846,862 | - | **7,846,862** | 3,764,373 |
| විනෝදාස්වාදය | 225,668 | 19,793 | **245,461** | 18,891 |
| වෘත්තිය ගාස්තු | 1,350,563 | - | **1,350,563** | 1,121,175 |
| රැස්වීම් වීයදම් | 548,189 | - | **548,189** | 143,897 |
| කාර්ය මණ්ඩල සුහසාධක වියදම් | 4,364,000 | - | **4,364,000** | - |
| කාර්ය මණ්ඩල පුහුණු කිරීම් | 724,083 | - | **724,083** | - |
| නීති වියදම් | 820,206 | - | **820,206** | - |
| උපදේශක ගාස්තු | 644,716 | 356,200 | **1,000,916** | 68,200 |
| අන්තර්ජාල විද්‍යුත් තැපැල් වියදම් | 759,809 | - | **759,809** | 469,583 |
| ඉන්ධන වියදම් | 468,467 | - | **468,467** | 560,964 |
| වාහන රක්ෂණය | 272,191 | 413,445 | **685,636** | 313,774 |
| වෛද්‍ය රක්ෂණය | 161,950 | 14,067 | **176,017** | 120,825 |
| පුවත්පත් සහ වාර සඟරා | 68,681 | - | **68,681** | 64,937 |
| IBSL | 400,000 | - | **400,000** | - |
| ආරක්ෂක ගාස්තු | 1,558,056 | - | **1,558,056** | 492,066 |
| ශාඛාව විවෘත කිරීම හා සම්බන්ධ වියද | - | | **-** | 472,175 |
| තැපැල් | 2,503,743 | 4,755 | **2,508,497** | 2,599,136 |
| වාහන නඩත්තුව | 490,032 | 680,012 | **1,170,044** | 732,585 |
| | 60,373,264 | 8,542,286 | **68,915,550** | 43,588,622 |
| **05 මූල්‍ය සහ වෙනත් වියදම්** | | | | |
| බැංකු ගාස්තු | 227,443 | 307,779 | **535,221** | 3,036,418 |
| විගණන ගාස්තු | - | 115,650 | **115,650** | 100,000 |
| ජාතිය ගොඩනැගීමේ බදු වියදම් | - | 14,584,151 | **14,584,151** | 23,001,951 |
| මුද්දර ගාස්තු | 56,150 | 217,500 | **273,650** | 42,223 |
| තාක්ෂණ උප කමිටු පැමිණීමේ ගාස්තු | - | 117,000 | **117,000** | 138,000 |
| ක්‍රියාකාරි කමිටු පැමිණීමේ ගාස්තු | - | 95,250 | **95,250** | 106,500 |
| විනිමය පාඩුව | - | - | **-** | 1,540,072 |
| මඩුලුවල පැමිණීමේ ගාස්තු | - | - | **-** | 6,000 |
| විවිධ වියදම් | 572,804 | - | **572,804** | 373,496 |
| අලෙවි ප්‍රවර්ධන වියදම් | 323,883 | - | **323,883** | - |
| ප්‍රචාරක වියදම් | 4,964,316 | - | **4,964,316** | 3,215,018 |
| | 6,144,596 | 15,437,330 | **21,581,925** | 31,559,678 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් (ඉතිරිය)

**මූල්‍ය ප්‍රකාශ පිළිබද සටහන්** *(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

**06 දේපල, පිරියත සහ උපකරණ**

| | මෝටර් වාහන | කාර්යාල උපකරණ | ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | මෘදුකාංග | විවිධ වත්කම් | මුළු ගණන |
|---|---|---|---|---|---|---|
| පිරිවැය | | | | | | |
| 2011/01/1 වන දිනට ශේෂය | 32,722,183 | 22,390,920 | 7,964,740 | 6,542,073 | 46,398 | 69,676,383 |
| එකතු කිරීම් | 1,748,071 | 3,751,862 | 168,201 | - | 25,590 | 5,693,724 |
| බැහැර කිරීම් | - | - | | - | - | - |
| 2011/12/31 වන දිනට ශේෂය | **34,470,254** | **26,142,782** | **8,132,941** | **6,542,073** | **71,988** | **75,370,107** |
| ක්ෂයවීම් | | | | | | |
| 2011/01/01 වන දිනට ශේෂය | 16,912,387 | 8,619,070 | 2,954,874 | 5,060,633 | 23,338 | 33,580,372 |
| වර්ෂය සඳහා බැදීම් | 6,123,337 | 3,941,524 | 1,004,353 | 1,113,643 | | 12,182,858 |
| වර්ෂය සඳහා බැහැර කිරීම් | - | - | - | - | - | - |
| 2011/12/31 වන දිනට ශේෂය | **23,035,724** | **12,560,594** | **3,959,227** | **6,174,276** | **23,338** | **45,763,230** |
| | | | | | | - |
| 2011/12/31 වන දිනට ලිඛිත ශේෂය | **11,434,530** | **13,582,187** | **4,173,714** | **367,797** | **48,650** | **29,606,877** |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් (ඉතිරිය)

**මූල්‍ය ප්‍රකාශ පිළිබද සටහන්** *සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි*

*දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය*

| | **2011 අග්‍රහාර හා වෙනත්** | **2011 SRCC & Tr.** | **2011 Total** | 2010 |
|---|---|---|---|---|
| **07. අයවිය යුතුදේ** | | | | |
| BFE වලින් අයවිය යුතු වාරික | 19,032,832 | - | **19,032,832** | 34,140,364 |
| භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු දේ | 174,321,548 | - | **174,321,548** | 174,321,548 |
| වෙනත් අයවිය යුතු දේ | 7,610,513 | 1,500 | **7,612,013** | 1,952,173 |
| අයවිය යුතු පොලී | 26,976,237 | 131,064,182 | **158,040,419** | 219,397,556 |
| **SRCC & Tr.වලින් අයවිය යුතු** | - | 338,879,954 | **338,879,954** | 234,261,889 |
| සකසුරුවම් සේවා ගාස්තු | 21,169,387 | - | **21,169,387** | 16,194,393 |
| | | 4,262,442 | **4,262,442** | 4,262,442 |
| අයවිය යුතු අත්තිකාරම් | 789,116 | 6,000,000 | **6,789,116** | 1,423,097 |
| ලැබිය යුතු ප්‍රතිරක්ෂණ වාරික | 110,153,464 | - | **110,153,464** | 87,44,599 |
| මෘදු ණය | | 1,054,801.014.00 | **1,054,801,014** | 1,159,234,472 |
| නැවත ගෙවිය යුතු තැන්පතු | | 11,611,080 | **11,611,080** | |
| කාර්ය මණ්ඩල ණය මුදල් | 974,103 | 9,000,000 | **9,974,103** | 1,693,218 |
| පෙර ගෙවුම් රක්ෂණ | - | 8,887,446 | **8,887,446** | 9,672,555 |
| පෙර ගෙවුම් වියදම් | - | 5,929 | **5,929** | 154,270 |
| සාමාජිකයන්ගෙන් අය විය යුතු | | | | |
| චෙක්පත් ආපසු ගෙවුම් | 2,273,818 | - | **2,273,818** | 1,667,318 |
| | 363,301,018 | 1,564,513,547 | **1,927,814,565** | 1,945,815,895 |
| **08 මුදල් සහ මුදල් සමකයන්** | | | | |
| බැංකුවේ ඇති මුදල් | 285,132,466 | 18,361,262 | **303,493,728** | 53,485,132 |
| අත ඇති මුදල් | 147,209 | 3,968 | **151,177** | 146,719 |
| කෙටිකාලීන ආයෝජන | - | 3,239,325,039 | **3,239,325,039** | 3,540,472,702 |
| | 285,279,675 | 3,257,690,269 | **3,542,969,944** | 3,594,104,553 |
| **09 සංචිත අරමුදල** | | | | |
| සංචිත අරමුදල | 1,721,046,466 | 7,974,420,689 | **9,695,467,155** | 9.364,852,296 |
| පූර්ව වර්ෂයේ ගැලපීම් | (17,717,155) | - | - | - |
| අඩු කළා ඒකාබද්ධ අරමුදලට | | | | |
| දෙන ලද සහභාග | | (3,495,000,000.00 | **(3,495,000,000.00** | (2,000,000,000) |
| වියදමට එරෙහිව ආදායම | 10,308,816 | 2,304,390,891 | **2,314,699,707** | 2,330,614,859 |
| | 1,713,638,127 | 6,783,811,580 | **8,515,166,862** | 9,695,467,155 |
| **10. නොඉපයූ වාරික** | | | | |
| 2010/12/31 වන දිනට ශේෂය | - | 821,564,804 | **821,564,804** | 1,046,825,276 |
| වර්ෂය සදහා වෙන් කිරීම් | - | 141,879,032 | **141,879,032** | (225,260,471) |
| 2011/12/31 දිනට ශේෂය | - | 963,443,837 | **963,443,837** | 821,564,804 |

# මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් (ඉතිරිය)

**මූල්‍ය ප්‍රකාශ පිළිබද සටහන්** *සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි*

*දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය*

| | 2011<br>අග්‍රහාර හා වෙනඃ | 2011<br>SRCC & Tr. | 2011<br>Total | 2010 |
|---|---|---|---|---|
| **11 විලම්භිත කොමිස්** | | | | |
| 2010/12/31 වන දිනට ශේෂය | - | 139,745,300 | **139,745,300** | 200,139,536 |
| වර්ෂය සදහා වෙන් කිරීම | - | 21,741,415 | **21,741,415** | (60,394,237) |
| 2011/12/31 දිනට ශේෂය | - | 161,486,715 | **161,486,715** | 139,745,300 |
| **12. ගෙවිය යුතු ලාභ කොමිස්** | | | | |
| ගෙවිය යුතු ලාභ කොමිස් | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| (2010 වර්ෂයේදී ගෙවිය යුතු වූ) | | | | |
| | - | 12,287,375 | **12,287,375** | 12,287,375 |
| **13. ගෙවිය යුතු හිමිකම්** | | | | |
| **ගෙවිය යුතු හිමිකම්** | 160,441,865 | 231,968,907 | **392,410,772** | 518,000,207 |
| | 160,441,865 | 231,968,907 | **392,410,772** | 518,000,207 |
| **14. වෙනත් ගෙවිය යුතු දේ** | | | | |
| උපචිත වියදම් | 7,683,966 | | **7,683,966** | 1,840,569 |
| ගෙවිය යුතු වෙනත් | 719,582 | 397,468 | **1,117,050** | 476,584 |
| ගෙවිය යුතු SRCC & Tr | 4,791,126 | - | **4,791,126** | 266,298 |
| ගෙවිය යුතු පාරිතෝෂිකය | 1,008,705 | | **1,003,705** | |
| ගෙවිය යුතු මාර්ග ආරක්ෂණ බදු | 534,523 | - | **534,523** | 514,746 |
| ගෙවිය යුතු වාරික ආපසු ගෙවීම් | - | 11,810,290 | **11,810,290** | 11,784,210 |
| සුබසාධක සංගමයට ගෙවිය යුතු දායක මුදල් | 54,477 | - | **54,477** | 307,807 |
| හිමිකම් චෙක්පත්/ගෙවිය යුතු තුන්ඩු ආපසු ලැබුම් | 2,733,700 | - | **2,733,700** | 2,197,021 |
| ගෙවිය යුතු විගණන ගාස්තු | - | 280,000 | **280,000** | 325,000 |
| ගෙවිය යුතු වැට් බදු සහ ජ.ගො.බදු | 39,991,444 | 20,376,173 | **60,367,618** | 50,577,142 |
| ගෙවිය යුතු ප්‍රතිරක්ෂණ | | 150,314,066 | **150,314,066** | 173,975,973 |
| | 57,512,524 | 183,177,997 | **240,690,521** | 242,265,350 |




# 10. විගණන වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல / My No: එෆ්බී/අයි/එන්ඩීටීඑෆ්/එෆ්ඒ/2011

ඔබේ අංකය / உமது இல / Your No:

දිනය / திகதி / Date: 2013 සැප්තැම්බර් දින.

සභාපති,

ජාතික රක්ෂණ භාර අරමුදල

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 17 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2013 මැයි 30 දින නිකුත් කරන ලදී.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

---

අංක 306/72 පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை இலங்கை
No.306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail: oaggov@sitnet.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාර බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

2. මූල්‍ය ප්‍රකාශන

2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

3

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ප්‍රකාරව පාර්ශ්වයන් වෙන් කිරීම් වෙනම අරමුදලක ආයෝජනය කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.275,231ක් වූ කාර්යාල උපකරණ සඳහා පසුව ගෙවා තිබුණු රු.80,575 ක මුදල, කාර්යාල උපකරණ ගිණුමට හර කරනු වෙනුවට මුද්‍රණ අග්‍රහාර වියදම් ගිණුමට හර කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී රු.482,541 කට මිලදී ගෙන තිබුණ මේස හා පුටු වටිනාකමෙන් රු.168,200 ක් ලී බඩු හා සවි කිරීම් යටතේ හා ඉතිරි රු.314,341 කාර්යාල උපකරණ යටතේ ගිණුම් ගත කිරීම නිසා ලී බඩු හා සවි කිරීම් රු.314,341 ක් අඩුවෙන් හා කාර්යාල උපකරණ රු.314,341 ක් වැඩියෙන්ද නිරූපණය විය. මේ නිසා වර්ෂයේ ලී බඩු හා උපකරණ ක්ෂය රු.18,525 ක් අඩුවෙන්ද කාර්යාල උපකරණ ක්ෂය රු.15,439 ක් වැඩියෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) 2011 දෙසැම්බර් 31 දින වන විට මුදල් ගෙවා හෝ භාණ්ඩ ආයතනයට ලැබී හෝ නොතිබුණු රු.1,130,316 ක්වූ පරිගණක හා පරිගණක උපාංග ශේෂ පත්‍රයෙහි වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයට අදාල රු.412,916 ක් වූ ගෙවිය යුතු ප්‍රචාරණ වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) අරමුදලට එරෙහිව වන්දි ලබාගැනීම සඳහා පවරනු ලැබූ නඩු 94 ක අසම්භාව්‍ය බැරකම වූ රු.218,354,555 ක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

4

## 2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 757(2), 757(4) | | සමාලෝචිත වර්ෂයට අදාලව භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 මාර්ගෝපදේශය | | ඕනෑම කොන්ත්‍රාත්තුවකට ගෙවීම් කිරීමේදී පිළිගත හැකි සුරක්ෂණයක් ඉදිරිපත් කිරීම මත, සියයට 20 ක අත්තිකාරමක් ගෙවිය හැකි වුවද, එට පටහැනිව කාර්යාල උපකරණ මිලදී ගැනීම වෙනුවෙන් සියයට 70 ක් හෝ රු.194,656 ක් අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3(iii) වගන්තිය | | භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව රු.2,073,317 ක් වූ දිරි දීමනා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණි. |
| (ඈ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | (i) | පරිගණක උපාංග සහ මෘදුකාංග මිලදී ගැනීමකදී සැපයුම්කරු වෙතින් පෝරම අංක 02 සිට 10 දක්වා වූ පරිගණක වත්කම් පිළිබඳව විස්තර සම්පූර්ණ කර ලබා ගත යුතු වුවත්, එලෙස ලබාගෙන නොතිබුණි. |
| | | (ii) | පරිගණක ස්ථාවර වත්කම් පිළිබඳව අභ්‍යන්තර විගණන අංශය ද අධීක්ෂණ කටයුතු සිදුකර සභාපති වෙත වාර්තා කිරීමද සිදුකර නොතිබුණි. |
| | | (iii) | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වල න්‍යාය පත්‍රයේ අනිවාර්ය අයිතමයක් වන පරිගණක ස්ථාවර වත්කම් පිළිබඳ සාකච්ඡා කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ වැඩ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.2,314,699,707 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා අතිරික්තය රු.2,330,614,859 ක් විය. ඉපයූ ශුද්ධ රක්ෂණ වාරික මුදලෙහි අඩුවීම නිසා ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.15,915,152 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පරිගණක 12 ක් මිලට ගැනීම සඳහා ලංසු කැඳවා අවම මිල ඉදිරිපත් කර තිබූ පුද්ගලික සමාගම සුදුසු බව තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබියදී, හදිසි අවශ්‍යතාවයක් සේ සලකා ඊට වැඩි මිලක් ඉදිරිපත් කර තිබූ පුද්ගලික සමාගමකට එම ප්‍රසම්පාදනය පිරිනැමීම නිසා ආයතනයට රු.85,980 ක අලාභයක් සිදුවී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී පරිගණක 18 ක් මිලට ගැනීම සඳහා ලංසු කැඳවා අවම මිල ඉදිරිපත් කර තිබූ පුද්ගලික සමාගමට ප්‍රසම්පාදනය ලබාදී පසුව එම ප්‍රසම්පාදනය අවලංගු කර වෙනත් ආයතනයට ප්‍රසම්පාදනය ප්‍රදානය කිරීම නිසා ආයතනයට රු.170,820 ක අලාභයක් සිදුවී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අරමුදලේ අයවැය ලේඛනය මගින් පරිත්‍යාග සඳහා රු.3,000,000 ක ප්‍රසම්පාදන සලසා තිබුණත්, එම සීමාව රු.4,846,862 කින් ඉක්මවා රු.7,846,862 ක් පරිත්‍යාග සඳහා වැයකර තිබුණි.

6

## 4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7 වගන්තිය ප්‍රකාරව පරිපාලන අත් පොතක් (Administration Manual) පිළියෙල කළ යුතු වුවද, ආයතනය ආරම්භ කර වසර 06 කට අධික කාලයක් ගත වී තිබුණද එම අත්පොත පිළියෙල කර නොතිබුණි. එමනිසා පරිපාලනයේදී මග පෙන්වීමක් ලෙස අදාල අත්පොත යොදා ගැනීමට නොහැකි වී තිබුණි.

(ආ) අරමුදල විසින් ගිනි, සමුද්‍ර, විවිධ යන රක්ෂණ කටයුතුවලින් උපයා ගැනීමට අපේක්ෂා කර තිබූ ආදායම් පිළිවෙලින් රු.මිලියන 250, රු.මිලියන 50 හා රු.මිලියන 1000 ක් ලෙස එකතුව රු.මිලියන 1,300 ක් වුවත් පොදු රක්ෂණ කටයුතු සීමා කිරීම හේතුවෙන් වර්ෂය තුල රැස්කර තිබුණේ පිළිවෙලින් රු.මිලියන 19.73, රු.මිලියන 2.12 හා රු.මිලියන 43.3 ක් ලෙස එකතුව රු.මිලියන 65.15 ක් එනම් අපේක්ෂා කළ ආදායමෙන් 5% ක් පමණි.

## 4.3 ද්‍රව්‍ය අක්‍රමිකතා / අවිධිමත් ගනුදෙනු

ශාඛා කළමනාකරුවන්ට ප්‍රවාහන දීමනා ගෙවීමේදී එම නිලධාරීන්ගේ නමට චෙක්පත් නිකුත් නොකර වෙනත් නිලධාරියකුගේ නමට චෙක්පත් නිකුත් කර ශාඛා කළමනාකරුවන්ගේ ගිණුම්වලට පසුව මුදල් තැන්පත් කර තිබුණි.

## 4.4 ආර්ථික නොවූ ගනුදෙනු

සමාලෝචිත වර්ෂයේදී රු.952,500 ක් වූ නිල ඇඳුම් (සාරි) මිලදී ගැනීමේදී අපේක්ෂිත පිරිවිතරයන්ට අනුකූල වී නොතිබුණු අතර, ඒ සඳහා වැඩි මිලක්ද ගෙවා තිබුණි. නිලධාරිනියන් අතුරින් විශාල පිරිසක් නිල ඇඳුම් භාවිතා නොකිරීම නිසා එම වියදම නිෂ්ඵල වී තිබුණි.

### 4.5 ප්‍රමාද වූ ව්‍යාපෘති

අග්‍රහාර ප්‍රතිලාභීන්ට ගනුදෙනු කිරීම සඳහා රු.21,450,000 ක් වූ චුම්භක කාඩ්පත් 650,000 ක් හා රු.370,000 ක් වූ චුම්භක කාඩ්පත් කියවන යන්ත්‍ර 20 ක් මිලදී ගැනීම සඳහා 2011 නොවැම්බර් 04 දින සමාගමකට ඇණවුම් භාරදී තිබුණි. මසක් ඇතුළත සැපයුම සම්පූර්ණ කිරීමට එම සමාගම එකඟ වී තිබුණද, එම කාලය තුළදී සපයා තිබුණේ කාඩ්පත් 250,000 ක් පමණි. අදාල සමාගමට රු.10,389,000 ක් ගෙවා ඇණවුම භාරදී 2013 අප්‍රේල් 30 දින වන විට මාස17 ක් ගතවී තිබුණද ඉතිරි කාඩ්පත් 400,000 හා යන්ත්‍ර 20 සපයා නොතිබුණි. එසේම සමාගම ලබාදී තිබුණු බැංකු ඇපකරයද 2012 අප්‍රේල් 22 දින වන විට අවසන් වී තිබුණි. ගනුදෙනුව සම්බන්ධව අරමුදලට සිදුවන අලාභය, කාල ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු හෝ අලාභය අයකර ගැනීමේ විධි විධාන ගිවිසුමේ ඇතුළත් කර නොතිබුණි.

### 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

අරමුදලේ සංවිධාන ව්‍යුහය ඉහල සිට පහලට බලතල හා වගකීම් පැවරෙන ආකාරයට (පිරමීඩාකාර) සකස් කර නොතිබුණි. සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වගකියන එක් එක් අංශ භාරව කටයුතු කරන කළමනාකරුවන් දෙදෙනෙකු සහ සහකාර කළමනාකරුවන් අට දෙනෙකුගෙන් සමන්විත වූ ආකාරයට අරමුදලේ සංවිධාන ව්‍යුහය සැකසී තිබුණි.

### 4.7 වාහන උපයෝජනය

අරමුදලේ රක්ෂිත වාහනයක් අනතුරකින් පසුව ගරාජය කර අරමුදල වෙත පවරා ගෙන රු.1,975,222ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. ස්ථාවර වත්කම් ලේඛනයේ එම වත්කම වටිනාකම ලෙස අළුත්වැඩියා වියදම පමණක් දන්වා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, මාස 10 කට අධික කාලයක් ප්‍රමාදව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි.

8

5.2 අභ්‍යන්තර විගණනය

අරමුදලේ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදුකිරීම සඳහා අභ්‍යන්තර විගණනයේ දායකත්වය ලබා ගැනීමේ ක්‍රමවේදයක් අරමුදල සතුව නොතිබීම නිසා අඩුපාඩු අඛණ්ඩව නිරීක්ෂණය විය. විගණන කටයුතු සඳහා කළමනාකරු තනතුර අනුමත කාර්යය මණ්ඩලය තුළ තිබුණ සුදුසු නිලධාරියකු පත්කර නොතිබුණි.

5.3 ප්‍රසම්පාදන සැලැස්ම

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව අරමුදල විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

5.4 අයවැය පාලනය

අයවැය ලේඛනගත සංඛ්‍යා හා සත්‍ය සංඛ්‍යා අතර සැලකිය යුතු විචලනයන් අනාවරණය වු අතර, අයවැය ලේඛනය සඵල කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණි.

6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු අරමුදලේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) භාණ්ඩ/ සේවා මිලදී ගැනීම
(ආ) මානවසම්පත් කළමනාකරණය
(ඇ) ගිණුම්කරණය
(ඈ) අයවැය පාලනය
(ඉ) අත්තිකාරම් ගෙවීම්
(ඊ) ගබඩා පාලනය

එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.




# 11.සය වසරක සාරාංශය

# මූල්‍ය කාර්යසාධනය - හය වසරක සාරාංශය

## ආදායම් හා වියදම් ප්‍රකාශය


*(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)*

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා* | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | |
| ශුද්ධ ඉපැයුම් වාරික ආදායම | 3,606,365,031 | 3,926,469,856 | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ, පාඩු හා වියදුම්** | | | | | | |
| රක්ෂණය, හිමිකම් පෑම් හා ප්‍රතිලාභ | (1,879,486,696) | (2,292,072,983) | (2,075,936,806) | (1,736,355,732) | (1,423,044,038) | (242,465,993) |
| | 1,726,878,335 | 1,634,396,873 | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **අනෙකුත් ආදායම්** | | - | - | - | | |
| ආයෝජන ආදායම | 723,412,241 | 798,117,037 | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මාදු ණය මත වූ පොලිය | 10,163,846 | 16,982,331 | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| වෙනත් ආදායම් | 743,614 | 1,006,353 | 471,787 | 917,841 | | |
| | 734,319,701 | 816,105,721 | 1,380,055,889 | 1,225,806,111 | 1,798,837,006 | 76,436,649 |
| **වියදම්** | | - | - | - | | |
| කාර්ය මණ්ඩලයට අදාළ වියදම් | 56,000,854 | 42,326,032 | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන වියදම් | 68,915,550 | 45,136,006 | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය හා වෙනත් | 21,581,925 | 32,425,697 | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **මූලු වියදම** | 146,498,329 | 119,887,735 | 120,772,099 | 55,114,528 | 29,029,109 | 2,980,916 |
| **වියදම ඉක්මවූ ආදායම** | **2,314,699,707** | **2,330,614,859** | **3,202,833,204** | **2,862,286,514** | **1,769,807,897** | **73,455,733** |

# මූල්‍ය තත්ත්වය - හය වසරක සාරාංශය

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| දෙසැම්බර් 31 වන දිනට, | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | |
| දේපල පිරියත සහ උපකරණ | 29,606,877 | 36,096,011 | 43,603,504 | 44,659,781 | 25,240,465 | 1,461,388 |
| ආයෝජන | 4,444,546,262 | 5,574,107,464 | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 | - |
| **ජංගම වත්කම්** | | | | | | |
| ලැබිය යුතු අය | 1,927,814,565 | 1,945,815,895 | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 | 511,844,970 |
| මුදල් සහ මුදලට සමාන දෑ | 3,542,969,945 | 3,594,104,553 | 110,173,003 | 239,795,258 | 560,259,122 | 13,357,202 |
| | 5,470,784,510 | 5,539,920,448 | 2,189,743,421 | 2,228,297,246 | 2,782,214,948 | 525,202,172 |
| **මුලු වත්කම්** | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |
| **ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | | | | | | |
| **ස්කන්ධ ප්‍රාග්ධනය** | | | | | | |
| සමුච්චිත අරමුදල | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 | 94,102,009 |
| **තාක්ෂණික සංචිත** | | | | | | |
| නොඉපැයූ වාරික | 963,443,837 | 821,564,804 | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 | |
| විලම්බිත කොමිස් මුදල | (161,486,715) | (139,745,300) | (200,139,536) | (206,999,340) | (161,317,228) | |
| | 801,957,122 | 681,819,505 | 846,685,740 | 856,318,432 | 716,378,499 | - |
| **බැරකම්** | | | | | | |
| **ජංගම නොවන බැරකම්** | | | | | | |
| ආණ්ඩුවේ පරිත්‍යාග | 142,150 | 284,330 | 719,190 | 719,190 | 719,190 | 719,190 |
| ගෙවිය යුතු ලාභ කොමිස් මුදල් | 12,287,375 | 12,287,375 | 63,762,150 | 113,635,474 | 83,722,067 | |
| | 12,429,525 | 12,571,705 | 64,481,340 | 114,354,664 | 84,441,257 | 719,190 |
| **ජංගම බැරකම්** | | | | | | |
| ගෙවිය යුතු හිමිකම් පෑම් | 392,410,772 | 518,000,207 | 329,499,921 | 333,321,632 | 602,777,397 | |
| වෙනත් ගෙවිය යුතු දේ | 240,690,522 | 242,265,350 | 178,033,863 | 306,121,335 | 269,692,571 | 431,842,361 |
| | 633,101,294 | 760,265,557 | 507,533,784 | 639,442,967 | 872,469,968 | 431,842,361 |
| **මුලු ස්කන්ධ ප්‍රාග්ධනය සහ බැරකම්** | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,647 | 10,022,135,643 | 8,256,798,653 | 526,663,560 |




# 14. සමායතනික තොරතුරු

# සමායතනික තොරතුරු

❖ **ආයතනයේ නම :**

ජාතික රක්ෂණ භාර අරමුදල

❖ **නෛතික ආකෘතිය :**

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

❖ **ලේඛනගත කාර්යාලය :**

ජාතික රක්ෂණ භාර අරමුදල

අංක 97, මරදාන පාර,

කොළඹ - 10.

❖ **විගණකවරු :**

විගණකාධිපති

❖ **බැංකුකරුවෝ**

මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව